# මහතෝරව එල්ලංගා පැතිකඩ සහ මූලික සංවර්ධන සැලැස්ම


**කෘෂිකර්ම අමාත්‍යාංශය**

**දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය**

**නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂක කාර්යාලය - වයඹ පළාත**

පටුන


1. හැඳින්වීම ........................................ 1

1.1. මහතෝරව එල්ලංගාව හා එහි පිහිටීම ........................................ 3

1.1.1. මහතෝරව එල්ලංගාවේ පිහිටීම ........................................ 4

1.1.2. ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් මහතෝරව එල්ලංගාව........................................ 1

1.1.3. මහතෝරව එල්ලංගාව හා එහි ව්‍යාප්තිය ........................................ 1

1.1.4. එල්ලංගාව පිළිබඳ සාමාන්‍ය තොරතුරු ........................................ 2

1.2. එල්ලංගාවේ වැව් පිළිබඳ තොරතුරු ........................................ 4

1.2.1. එල්ලංගාවට අයත් වැව් සම්බන්ධ මූලික තොරතුරු ........................................ 5

1.2.2. එල්ලංගාවට අයත් වැව් ආශ්‍රිත භූමි පරිබෝජනය සම්බන්ධ තොරතුරු ........................................ 5

1.3. මහතෝරව එල්ලංගාව තිරසර ලෙස කළමනාකරණය කිරීමේ වැදගත් කම ........................................ 08

2. එල්ලංගා කළමණාකරන කමිටු පිහිටුවීම ........................................ 09

2.1. එල්ලංගා කළමණාකරන කමිටුවක අවශ්‍යතාවය ........................................ 12

2.2. එල්ලංගා පැතිකඩක් සකස් කිරීමේ අවශ්‍යතාවය ........................................ 13

2.3. එල්ලංගා පැතිකඩක් සකස් කිරීමේ දී අනුගමනය කල ක්‍රමවේදය ........................................ 13

2.4. එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම සැකසීමේ වැදගත්කම. . 16

2.5. එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීමේ දී අනුගමනය කරන ලද ක්‍රමවේදය ........................................ 16

3. මහතෝරව එල්ලංගාවේ වර්තමාන පැතිකඩ ........................................ 17

3.1. භූගෝලීය (Geographical ) තොරතුරු ........................................ 17

3.2. භූ විද්‍යාත්මක (Geological) තොරතුරු ........................................ 17

3.3. ජල විද්‍යාත්මක (Hydrological)තොරතුරු ........................................ 18

3.4. පරිසර විද්‍යාත්මක(Environmental) තොරතුරු ........................................ 19

3.5. එල්ලංගාව තුළ සිදුවන මානව ජීවනෝපාය ක්‍රියාකාරකම් ........................................ 21

3.6. එල්ලංගාවේ සමාජ ආර්ථික තොරතුරු ........................................ 21

3.7. එල්ලංගාවේ පවතින ඉදිකිරීම් ........................................ 24

3.8. එල්ලංගාවේ කෘෂිකාර්මික බෝග වගා රටාව ........................................ 24

3.9. එල්ලංගාවේ වාරිමාර්ග කළමනාකරණය ........................................ 25

4. මහතෝරව එල්ලංගාව මුහුණදෙන මූලික අභියෝග හඳුනා ගැනීම ........................................ 26

4.1. එල්ලංගාව මුහුණදෙන ප්‍රධාන අභියෝග ........................................ 26

4.2. මහතෝරව හරස්කඩ චාරිකාවෙන් හඳුනාගත් ප්‍රමුඛතාගත කල ගැටලු හා යෝජිත උපාය මාර්ග හා සැලැස්ම ........................................ 29

4.3. බොරරවැව එල්ලංගාව සම්බන්දයෙන් හඳුනාගත් උග්‍ර ගැටළු විසඳීම සඳහා යෝජිත ක්‍රියාත්මක සැලැස්ම ........................................ 34

5. ඇමුණුම් ........................................ 37

වගු


වගු අංක - 01 මහතෝරව එල්ලංගාව අයත් ග්‍රාම නිලධාරි කොට්ඨාශ වල තොරතුරු .......................1
වගු අංක - 02 මහතෝරව එල්ලංගාව පිළිබද සාමාන්‍ය තොරතුරු .......................2
වගු අංක - 03 දේශගුණ සුහුරු ව්‍යාපෘතිය මගින් ප්‍රතිසංස්කරණය කරන ලද එල්ලංගාවට අයත් වැව් පිළිබද තොරතුරු .......................4
වගු අංක - 04 එල්ලංගාවට අයත් වැව් ආශ්‍රිත භූමි පරිභෝජනය සම්බන්ධ තොරතුරු .......................5
වගු අංක - 05 හරස්කඩ වාරිකා පිළිබද තොරතුරු .......................6
වගු අංක - 06 මහතෝරව එල්ලංගාවට අයත් වැව් සඳහා වාර්ෂික හා මාසික වර්ෂාපතන සම්බන්ධ තොරතුරු .......................7
වගු අංක - 07 එල්ලංගා කළමණාකරන කමිටුව විසින් උග්‍ර ගැටළු විසඳා ගැනීම හෝ අවම කිරීම සඳහා යෝජිත ප්‍රධාන ක්‍රියාකාරකම් .......................14
වගු අංක - 08 හඳුනාගත් උග්‍ර ගැටළු විසඳීම සඳහා යෝජිත ක්‍රියාත්මක සැලැස්ම.......................18


රූප සටහන්


රූපසටහන -01 පැරණි එල්ලංගාවක පිහිටීම .......................1
රූපසටහන - 02 පැරණි වැවක පවතින ප්‍රධාන කොටස් .......................3
රූපසටහන - 03 එල්ලංගා පද්ධති කළමණාකරනය සඳහා වර්තමානයේ සම්බන්ධිත ප්‍රධාන ආයතන .......................11


සිතියම්


සිතියම් අංක - 01 මහතෝරව එල්ලංගාවට අයත් වැව් වල පිහිටීම .......................1
සිතියම් අංක - 02 මහතෝරව එල්ලංගාව අයත් වන ග්‍රාම නිලධාරි කොට්ඨාශ .......................1
සිතියම් අංක - 03 මහතෝරව එල්ලංගාව (ගූගල් සිතියමක් ආශ්‍රිතව ).......................18
සිතියම් අංක - 04 මහතෝරව එල්ලංගාව ආශ්‍රිතව පස.......................18
සිතියම් අංක -05 මී ඔය ද්‍රෝණිය තුල මහතෝරව එල්ලංගාවේ පිහිටීම .......................19


ප්‍රස්තාර


ප්‍රස්තාර අංක -01 එල්ලංගාවේ භූමි පරිභෝජනය .......................22
ප්‍රස්තාර අංක - 02 මැදියාව මධ්‍යස්ථානයට අයත් ප්‍රදේශ සඳහා සාමාන්‍ය මාසික වර්ෂාපතනය වෙනස්වීම .......................23
ප්‍රස්තාර අංක - 03 අතරගල්ල මධ්‍යස්ථානයට අයත් ප්‍රදේශ සඳහා සාමාන්‍ය මාසික වර්ෂාපතනය වෙනස්වීම .......................23
ප්‍රස්තාර අංක - 04 ඉඟිනිමිටිය මධ්‍යස්ථානයට අයත් ප්‍රදේශ සඳහා සාමාන්‍ය මාසික වර්ෂාපතනය වෙනස්වීම .......................**Error! Bookmark not defined.**
ප්‍රස්තාර අංක - 05 එල්ලංගාවේ ජනගහනය .......................22
ප්‍රස්තාර අංක - 06 අධ්‍යාපන මට්ටම .......................23
ප්‍රස්තාර අංක - 07 රැකියා නියුක්තිය .......................29

## 1. හැඳින්වීම

ප්‍රාථමික ජල මාර්ගයක හෝ ප්‍රාථමික ජල මාර්ග ජාලයක පිහිටා ඇති ජල විද්‍යාත්මක ලෙස එකට බැඳුනු කුඩා හා මධ්‍ය පරිමාණයේ වැව් පද්ධති හෝ කුඩා වැව්, මධ්‍ය ප්‍රමාණයේ වැව් සහ අමුණු පද්ධති, වලින් සමන්විත වූ ද්විතිය හා තෘතිය ජල මාර්ගයකට ජලය මුදා හරිනු ලබන මධ්‍ය ජල ධාරා ප්‍රදේශය එල්ලංගාව ලෙස හඳුන්වනු ලබයි. එල්ලංගාව අපගේ වාරි ශිෂ්ඨාචාරයේ විශිෂ්ඨ නිර්මාණයකි. එමගින් මුලු පරිසර පද්ධතියේම තිරසර පැවැත්ම තහවුරු කරයි.

වාරි ශිෂ්ඨාචාරයේ මෙම මාහැඟි අමිල නිර්මාණයක් වන එල්ලංගාව සංරක්ෂණය කර මනා කළමණාකරනයක් තුලින් "දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ" සංවර්ධන කටයුතු තිරසර ලෙස පවත්වා ගෙන යාම සඳහා එල්ලංගා කළමණාකරනය පහසු කිරීමට ව්‍යාපෘති ප්‍රතිලාභීන්ගෙන් සහ සියලුම රාජ්‍ය හා පෞද්ගලික ආයතන වලින් සමන්විත එල්ලංගා කළමණාකරන කමිටු පිහිටු වීමට ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය කටයුතු කරනු ලබයි. එල්ලංගාවේ සියලු පාර්ශව එකතු වී සියලු සම්පත් මනාව කළමණාකරනය කිරීම එල්ලංගා කළමණාකරන කමිටුවල මූලික වගකීම වන අතර එම කාර්යය පහසු කිරීම සඳහා අවශ්‍ය සැලසුමක් සැකසීමට අවශ්‍ය තොරතුරු එකතු කිරීම සඳහා එල්ලංගා පැතිකඩක් පළාතේ සෑම එල්ලංගාවක් සඳහාම සකස් කරනු ලබයි. එල්ලංගා කළමණාකරන කමිටුව හරහා එල්ලංගාව හා ජලධාරා ප්‍රදේශය ආරක්ෂා කිරීමේ අපේක්ෂාවෙන් සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කළමණාකරන සැලැස්ම සකස් කර ඇත.එල්ලංගා පැතිකඩක් සැකසීමේ ප්‍රධාන අපේක්ෂාව වන්නේ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කිරීමයි.




රූපසටහන 01- පැරණි එල්ලංගාවක පිහිටීම

මෙවැනි එල්ලංගා පද්ධතියක් නිසි ආකාරව පවත්වා ගැනීමටත් නිසි කළමනාකරණයකින් යුක්තව එල්ලංගාවේ ජලය බෙදා හැරීමටත් සුදුසු වන පරිදි අතීතයේ සිටම වාරි පද්ධතිය නිර්මාණය කර ඇත. ඒ

අනුව එල්ලංගාවේ ප්‍රධානතම අංගයක් වන වැවක අනිවාර්යයෙන්ම පැවතිය යුතු අංග කිහිපයක් පවතී. මෙම අංග නිසි ආකාරව ඉදි කිරීම හා නිසි ආකාරව නඩත්තු කිරීම එල්ලංගාවේ මනා ක්‍රියාකාරීත්වයට සෘජුවම බලපායි. ඒ අනුව එල්ලංගා පද්ධති කළමනාකරනයේ දී වැවක පැවතිය යුතු පහත කොටස් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම ඉතා වැදගත් වේ. සාම්ප්‍රදායික වාරි පරිසර පද්ධතියක ප්‍රධාන අංගයක් ලෙස වැව හඳුනාගත හැක. ඒ අනුව වැවක පැවතිය යුතු ප්‍රධාන අංග ලෙස සොරොව්ව, වැව් බැම්ම, වාන, වාන් ඇළ, රළපනාව, ඇළ වේලි, කට්ට කඩුව, ගොඩවල, පෙරහන, කුණු ඇළ ආදී කොටස් හඳුනා ගත හැක. වැවක අනිවාර්යයෙන් පැවතිය යුතු මෙම අංග සම්බන්ධව ඇතිවන ගැටළු වැව ආශ්‍රිතව සිදුකරන කෘෂිකාර්මික, ධීවර ආදි නිෂ්පාදන කෙරෙහිද අනෙකුත් මානව හා පාරිසරික ක්‍රියාකාරකම් කෙරෙහි ද සෘණාත්මකව බලපානු ලබයි.

<u>කට්ට කඩුව</u>

වැවක කට්ට කඩුව සාමාන්‍යයෙන් වැව් බැම්මට පහතින් වැව් බැම්මේ සිට මීටර 5ක වපසරියක් තුල සිටුවන ලද ගස් වලින් සමන්විත වේ. මෙමගින් වැව් බැම්මේ ආරක්ෂාව, ඇළ වේලි මගින් ගලායන ජලයේ කිවුල උරා ගැනීම ආදි ප්‍රයෝජන ලබා ගත හැකි වේ.

<u>පෙරහන ( උස්වැටිය )</u>

වැවක පෙරහන ලෙස හඳුන්වන්නේ වැව වටා වැවට ගලා ඒන ජලය පෙරීමකට භාජනය වීම තුලින් වැවට රොන්මඩ හා කැලි කසල ඒකතු වීම වැලැක්වීම සඳහා සකසා ඇති ගස් ගොම්මනකි. මෙය වැවේ ජලය රඳාපැවතීම සඳහා ද ප්‍රයෝජනවත් වේ.

<u>පිටවාන හා වාන් ඇළ</u>

වර්ෂාව සහිත කාල සීමාවලදී වැවේ වැඩි වතුර පිටාර යාම සඳහා පිටවාන සහ එසේ පිටාර යන වතුර විධිමත් පරිදි එල්ලංගාවේ වෙනත් වැවකට හෝ ජල මාර්ගයකට ගලා ගෙන යාම සඳහා වාන් ඇළ නිර්මාණය කර ඇත. මෙසේ පිටවාන හෝ වාන් ඇල අවිධිමත්වීම ගංවතුර තත්ත්ව ඇතිවීමට හා වැවේ ධාරිතාවය අඩු වැඩි වීමට හේතු වේ.

<u>සොරොව්ව</u>

වැවක ජලය වර්ෂාව නොමැති කාල වලදී නිසි කළමනාකරණයකින් යුක්තව නිකුත් කිරීම සඳහා සොරොව්ව පිහිටුවා ඇත. නිසි කළමනාකාරණයකින් යුක්තව ජලය බෙදා හැරීම මගින් වර්ෂාව හිඟ කාලසීමා වලදී කෘෂිකාර්මික කටයුතු වලට මෙන්ම වෙනත් මානව ක්‍රියාකාරකම් සඳහා ද ජලය ගබඩා කර ගැනීමට හැකියාව ලැබේ.

<u>ඇළවේලි</u>

වර්ෂාව හිඟ කාලවලදී සොරොව්වෙන් නිකුත් කරන ජලය විධිමත්ව වගා බිම් වෙත යොමු කිරීම මෙමගින් සිදු කරයි. මෙය වර්ෂාව හිඟ කාලසීමාවේ දී වැවේ ජලය නිසි කළමනාකරනයකින් යුක්තව භාවිතා කිරීමට බෙහෙවින් උපකාරී වේ. ඇළවේලි විධිමත් නොවීම අවිධිමත් ජල කළමනාකරණයට හා වර්ෂාව හිඟ කාලවලදී වගාබිම් වලට ජලය හිඟවීමට හේතු වේ.

<u>ගොඩවල</u>

අතීතයේ සිට වැවක පැවතිය යුතු අංග කුමන හෝ විශේෂිත කාරණයක් මත වැව හා සම්බන්ධ කර ඇත. වැවක ගොඩවල යනු වැවට ජලය එකතු වීමට පෙර වැවට ඉහළින් වැවේ ප්‍රමාණය හා වැවට එකතුවන ජල ධාරාවේ ප්‍රමාණය අනුව පහත් බිමක් (වලක්) ලෙස සකස් කර ඇති ඉඩ ප්‍රදේශයයි. මෙමගින් වැවට ජලය එකතුවීමට පෙර එම වලට එක්රැස් වන බැවින් ජලයේ ඇති රොන්මඩ ආදිය එම වලෙහි තැන්පත් වී පිරිසිදු ජලය වැවට එක්රැස් වීම සිදු වේ. එමගින් වැව ගොඩවීම හා වැව අපිරිසිදු වීම වැලකී යයි.

<u>වැව් බැම්ම</u>

වැවක ප්‍රධානතම අංගය වන්නේ වැව් බැම්ම වේ. යම් කිසි ජලමාර්ගයක් හරස් කර ජලය එක්රැස් කර ගැනීම සඳහා සකස් කර ඇති බැම්ම වැව් බැම්ම ( වැකන්ද) ලෙස හැඳින්වේ. වැව් බැම්මේ දිග, පළල හා උස වැවේ ජල ධාරිතාවය අනුව වෙනස් වේ. සාමාන්‍යයෙන් වැවේ එකතු වන ජලයේ පීඩනය දැරිය හැකිවන පරිදි අර්ධ කවාකාර ආකාරයට මෙය නිර්මානය කර ඇත. වැවක වැව් බැම්මේ ශක්තිමත් බව ඉතා වැදගත් වේ. ජලය කාන්දු නොවන ආකාරයේ ශක්තිමත් වැව් බැම්මක් පිහිටීම වැවේ ජලය අපතේ නොයාමට හා වැවට පහතින් පිහිටි පහත්බිම් ආරක්ෂාවීමට හේතු වේ.



රූපසටහන 02 - පැරණි වැවක පවතින ප්‍රධාන කොටස්

## 1.1. මහතෝරව එල්ලංගාව හා එහි පිහිටීම

### 1.1.1 මහතෝරව එල්ලංගාවේ පිහිටීම

වර්ග කිලෝමීටර් 272.19 ක පමණ වූ ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ උතුරු මායිමට ආසන්නව පිහිටා ඇත. මෙම කොට්ඨාශයේ සාපෙක්ෂ පිහිටීම උතුරින් ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය හා අනුරාධපුර දිස්ත්‍රික්කයෙන්ද දකුණින් ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් හා අඹන්පොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන්ද නැගෙනහිරින් ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් හා අනුරාධපුර දිස්ත්‍රික්කයෙන්ද බස්නාහිරින් පුත්තලම දිස්ත්‍රික්කයෙන්ද මායිම් වේ. ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නිරපේක්ෂ පිහිටීම අනුව උතුරු ග්‍රීඩ් ඛණ්ඩාංක 303 - 323ට සීමා වන අතර නැගෙනහිර ඛණ්ඩාංක 129 - 156 ත් අතර පිහිටා ඇත.

අතීතයේ "ධූමක කද්දීර දේශය" ලෙස හඳුන්වා දී ඇති ගල්ගමුව ප්‍රදේශය ආර්ය ජනාවාස ආරම්භ වූ මුල් යුගයේ සිටම මෙම ප්‍රදේශය ජනාවාස වී කෘෂිකාර්මික, ආගමික මෙන්ම සංස්කෘතික දියුණුවකින් යුක්ත වූ බවට තොරතුරු ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක සාධක වලින් තහවුරු වේ.

එමෙන්ම ශ්‍රී ලංකාවේ අක්ෂර කලාව දියුණු තත්වයේ පසු වූ බවට හෙළි කරන්නාවූ සාක්ෂියක් ගල්ගමුව ප්‍රදේශයේ හමුවූ සෙල්ලිපියකින් හෙළි වී ඇත. එනම් "පරුමක ශමුදහ ලෙණෙ කොනගම නම කරපිති අදකරෙන කොනගම" වශයෙනි.

ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වසම් 62 කින් සමන්විත වේ. 2023 වර්ෂය ජන සංගණනයට අනුව මුළු ජනගශනය 68923 ක් වන අතර ගැහැණු සංඛ්‍යාව 35526 ක් වන අතර පිරිමි සංඛ්‍යාව 33367 කි. ජනඝනත්වය වර්ග කිලෝමීටර් 1ට 253 (2023).

ගල්ගමුව ප්‍රදේශයේ වගාකරන ප්‍රධානතම කෘෂිකාර්මික බෝගය ලෙස වී බෝගය හැදින්විය හැක. කොට්ඨාශයේ මුළු කුඹුරු ප්‍රමාණය 6077.03 ක් වන අතර පුරන් වූ කුඹුරු ප්‍රමාණය හෙක්ටයාර හෙක්ටයාර 8.5 කි. (නාන්නේරිය ගොවිජන සේවා බල ප්‍රදේශය). වගාකල කුඹුරු ප්‍රමාණය යල කන්නය (2022 වර්ෂය) හෙක්ටයාර 3200.9 ක් වන අතර අස්වැන්න මෙට්‍රික් ටොන් 9044.27 කි. මහ කන්නය හෙක්ටයාර 5233.6 ක් වන අතර අස්වැන්න මෙට්‍රික් ටොන් 13371.325 කි. 2023 වර්ෂයේ එය යල කන්නය හෙක්ටයාර 2639.29 වන අතර අස්වැන්න මෙට්‍රික් ටොන් 8383.781ක් වේ.

මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රධාන වශයෙන්ම කැපී පෙනෙන ලක්ෂණය වනුයේ ප්‍රදේශය පුරාම ව්‍යාප්ත වී ඇති වැව් සමුහය වේ. මහා වාරිමාර්ග සනයට වැටෙන වැව් ලෙස උස්ගල සියඹලන්ගමුව වැව හා පාළුකඩවල දැක්විය හැක. මධ්‍ය පරිමාණ වැව් ලෙස කුඹුක්වැව, ඉහල වැව ආදී වැව් දැක්විය හැක . මීට අමතරව කුඩා පරිමාණ වාරිමර්ග වැව් 244 ක් වන අතර ජල ධාරිතාවය අක්කර අඩි 10756කි.
වගාකරන කුඹුරු අක්කර ප්‍රමාණය හෙක්ටයාර 4729 ක් වන අතර ගොවීන් සංඛ්‍යාව 4216 කි.

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නාන්නේරිය ගොවිජන සේවා බල ප්‍රදේශයේ අංක 44 තෝරව ග්‍රාම නිලධාරී කොට්ඨාශ තුල මහතෝරව එල්ලංගා පද්ධතිය පිහිටා ඇත. මී ඔය ද්‍රෝණියේ තුන්වන උපද්‍රෝනියේ මෙම එල්ලංගාව පිහිටා ඇත. ගල්ගමුව

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ එල්ලංගා පද්ධති වශයෙන් එල්ලංගා පද්ධති 05 ක් පිහිටා ඇත. එල්ලංගා පද්ධති 05 ගල්ගමුව හා නාන්නේරිය යන ගොවිජන සේවා බල ප්‍රදේශ 02 ක තුළ පිහිටා ඇත. ඉන් එල්ලංගා පද්ධති 04 ක් දේශගුණ සුහුරු ව්‍යාපෘතිය මගින් ප්‍රතිසංස්කරණය කරනු ලබන අතර මහතෝරව එල්ලංගාවද ඉන් එකකි. එල්ලංගා පද්ධති 05ට අදාළ මුළු වැව් ගණන 39 කි. මහතෝරව එල්ලංගාව (වැව් 08), නාහෙට්ටිකුලම (වැව් 12), පහකහිගුරුවැව (වැව් 02) හා පුංගන්කුලම(වැව් 03) හා පාඩිපංචාව (වැව් 14) ලෙස හැඳින්විය හැක.

මහතෝරව එල්ලංගා පද්ධතියට වැව් 08 හදුනාගෙන ඇත. මෙම වැව් අතරින් හඳුනාගත් වැව් 04ක් දේශගුණ සුහුරු ව්‍යාපෘතිය මගින් සංවර්ධන කිරීම සඳහා තෝරාගෙන ඇත. ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකරන ලද්දේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මගිනි. වසමට අදාළ ගම්මාන ලෙස මහතෝරව, උඩතෝරව, මල්නයිදාගම, පූංගන්කුලම, මයිලැව හා හල්මිල්ලැව දැක්විය හැක. මෙම ග්‍රාම නිලධාරි කොට්ඨාශයට අයත් මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර 793.6 කි. මුළු ජනගහනය 1019 (ගැහැණු -514, පිරිමි-505) කි. වසම තුල පිහිටි වැව් ගණන 12 කි. බල ප්‍රදේශයේ වැඩි ඉඩම් ප්‍රමාණයක් පාරම්පරික කුඹුරු වගා කරනු ලබන ගොවීන් වන අතර තෝරව මයිලැව පුරාණ රජමහා විහාරයට පන්සල් වැව අයත්ය. පන්සල් ඉඩම් වල අදේට වගා කරනු ලබන ගොවීන්ද ඒ අතර වේ. පිහිටීම අනුව එල්ලංගාවේ පහල මායිම මුහුදු මට්ටමේ සිට මීටර් ............ක් පමණ උස වන අතර එල්ලංගා පද්ධතියේ ඉහල මායිමේ උස මීටර් ..........ක් පමණ වේ. හුදකලා කඳු කිහිපයක් හැරුණු විට සම්පූර්ණ එල්ලංගා පද්ධතියම මීටර් .......... කට වඩා අඩු උසකින් යුත් සාමාන්‍ය තැනිතලා භූමියකි. වැව් ආශ්‍රිතව ගල් සහිත උස් බිමක් පිහිටා ඇති අතර මුළු එල්ලංගා පද්ධතිය කුඹුරු අක්කර (වැව් 08ට අදාලව) 192 ක් ද වන අතර වැව් වල පෝෂක ප්‍රදේශය ලෙස අක්කර 147.5 ක් ද හඳුනා ගත හැක.

මහතෝරව එල්ලංගාව සම්බන්ධයෙන් ද ජනප්‍රවාදයන් පවතී. පරාක්‍රම රජු සමයේ මෙම ප්‍රදේශය වැවක් තිබූ බවත් පවුල් දෙකකින් ආරම්භ කර පසුව මහතෝරව නමින් ගමක් සැදුණු බව ජනප්‍රවාදයේ පවතී.

සිතියම් අංක 01 - මහතෝරව එල්ලංගාවට අයත් වැව් වල පිහිටීම




මූලාශ්‍රය - දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම සැලැස්ම

### 1.1.2. ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් මහතෝරව එල්ලංගාව

වගු අංක 01 - මහතෝරව එල්ලංගාව අයත් ග්‍රාම නිලධාරි කොට්ඨාශ වල තොරතුරු

| අංක | ග්‍රානි. කොට්ඨාශයේ නම හා අංකය | ව්‍යාපෘතිය හෙක්. | ජනගහනය | | ප්‍රදේශය තුල ගොවි සංවිධාන |
|---|---|---|---|---|---|
| | | | ස්ත්‍රී | පුරුෂ | |
| 01 | තෝරව - 44 | 793.6 | 514 | 505 | 02 |

### 1.1.3. මහතෝරව එල්ළංගාව හා එහි ව්‍යාප්තිය

නාන්නේරිය ගොවිජන සේවා බල ප්‍රදේශයේ අංක - 44 තෝරව ග්‍රාම නිලධාරි කොට්ඨාශ තුල මහතෝරව එල්ලංගා පද්ධතිය පිහිටා ඇත.

සිතියම් අංක 02 - මහතෝරව එල්ලංගාව අයත් වන ග්‍රාම නිලධාරි කොට්ඨාශ



## 1.1.4. එල්ලංගාව පිළිබඳ සාමාන්‍ය තොරතුරු

වගු අංක 02 - මහතෝරව එල්ලංගාව පිළිබඳ සාමාන්‍ය තොරතුරු

| මූලික තොරතුරු | විස්තර | විශේෂිත කරුණු |
|---|---|---|
| දිස්ත්‍රික්කය | කුරුණෑගල | |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ගල්ගමුව | වපසරිය - වර්ග කිලෝමීටර් 272.19<br>ග්‍රාම නිලධාරි කොට්ඨාශ - 62<br>ගැහැණු -35526<br>පිරිමි - 33367<br>මුළු ගණන - 68923 |
| මැතිවරණ බලප්‍රදේශය | ගල්ගමුව | ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නිරපේක්ෂ පිහිටීම අනුව උතුරු ග්‍රීඩ් ඛණ්ඩාංක 303-323ට සීමා වන අතර නැගෙනහිර ඛණ්ඩාංක 129-156 ත් අතර පිහිටා ඇත. |
| ගංගා ද්‍රෝණිය | මී ඔය | ගංගා ද්‍රෝනිය වර්ග කි.මී.1530 පුරා ව්‍යාප්තව් ඇති අතර දිග කි.මී.118 වේ. |
| එල්ලංගාව | මහතෝරව | නාන්නේරිය ගොවිජන සේවා බල ප්‍රදේශයේ පිහිටා ඇත. |
| එල්ලංගාවට අයත් වැව් සංඛ්‍යාව | 08 | මේ අතරින් ප්‍රමුඛතාවය අනුව තෝරාගත් වැව් 04 ක් (උඩතෝරව, මහතෝරව, හල්මිල්ලැව, පන්සල් (පිං වැව යන වැව් ) දේශගුණ සුහුරු ව්‍යාපෘතිය මගින් සංවර්ධනය කර ඇත. |
| කෘෂි කාර්මික කටයුතු සඳහා යොදා ගන්නා වැව් සංඛ්‍යාව | 08 | කෘෂිකාර්මික කටයුතු සඳහා යොදාගත්තද මයිලැව, කෝන්වැටිය, අළුත්තැව යන වැව් වලට සොරොව්ව වාන නොමැති වැව්ය. |
| ග්‍රාම නිලධාරී කොට්ඨාශය | තෝරව - 44 | තෝරව ග්‍රාම නිලධාරී කොට්ඨාශය තුල කෝන්වැටිය, මහතෝරව, ඉහල මල් නයිදාගම උඩතෝරව, හල්මිල්ලැව , මයිලැව, ඉහල හිගුරු, පහල හිගුරු, කොකැව, කුඹුක්කඩවල වැව, පන්සල්, පූංගන්කුලම යන වැව් පිහිටා ඇත. |

| | | |
|---|---|---|
| එල්ලංගාව අයත් ග්‍රාම නිලධාරි කොට්ඨාශයට අයත් මුළු භූමි ප්‍රමාණය | හෙක්ටයාර 793.6 | |
| එල්ලංගාවට අයත් භූමි ප්‍රමාණය | හෙක්ටයාර 529.6 | |
| එල්ලංගාවෙන් පෝෂිත කෘෂි බිම් | මඩ ඉඩම් හෙක්.120<br>ගොඩ ඉඩම් හෙක්. 180 | වී වගාව මහ කන්නය - හෙක්.120<br>යල කන්නය - හෙක්.26<br>වාර්ෂික නිෂ්පාදනය මෙට්‍රික් ටොන් -<br>අතිරේක බෝග - බඩ ඉරිඟු, රටකජු, ඇණු, මුං<br>පලතුරු - පැණි කොමඩු, කෙසෙල්<br>වානිජ බෝග - පොල් |
| එල්ලංගාවට අයත් ප්‍රතිසංස්කරණය කරන ලද වැව් වල මුළු ජල ධාරිතාවය | අක්කර අඩි 130 | |
| ප්‍රතිසංස්කරණය කරන ලද වැව් වලට අදාල මුළු පෝෂිත කුඹුරු අක්කර ගණන | අක්කර 147.5 | උඩතෝරව වැව, මහතෝරව වැව, හල්මිල්ලෑව, පන්සල් වැවට අදාළව |
| පෝෂක ප්‍රදේශයේ පදිංචි පවුල් සංඛ්‍යාව | 360 | තෝරව වසම තුල |
| ප්‍රතිලාභ ලබන<br>පවුල් සංඛ්‍යාව | 221 | පෝෂිත කුඹුරු අක්කර 147.5 |
| එල්ලංගාවට අයත් ගොවි සංවිධාන | 02 | මහතෝරව ග්‍රාම නිලධාරි වසම - මහතෝරව ගොවි සංවිධානය, උඩ තෝරව ගොවි සංවිධානය |

මුලාශ්‍රය-ගල්ගමුව සම්පත් පැතිකඩ 2023

## 1.2. එල්ලංගාවේ වැව් පිළිබඳ තොරතුරු

### 1.2.1. එල්ලංගාවට අයත් වැව් සම්බන්ධ මූලික තොරතුරු

වගු අංක 03 - දේශගුණ සුහුරු ව්‍යාපෘතිය මගින් ප්‍රතිසංස්කරණය කරන ලද එල්ලංගාවට අයත් වැව් පිළිබඳ තොරතුරු

| වැවෙහි නම | ග්‍රාම නිළධාරි වසම | ජලාශයේ ප්‍රමාණය (අක්කර) | භාවිතයට ගනු ලබන සහ අත්හරින ලද වැවක්ද යන්න | ජල ධාරිතාවය (අක්කර අඩි) | එම වැවේ ප්‍රතිලාභී ගොවි පවුල් සංඛ්‍යාව | වැවෙන් පෝෂණය වන වගා භූමි ප්‍රමාණය (කුඹුරු අක්කර) | භූගෝලීය ඛණ්ඩාංක | |
|---|---|---|---|---|---|---|---|---|
| මහතෝරව | තෝරව | 70 | භාවිතයට ගනු ලැබේ | 60 | 138 | 86.00 | 7.956881 | 80.16557 |
| උඩතෝරව | තෝරව | 60 | භාවිතයට ගනු ලැබේ | 40 | 50 | 27.75 | 7.959834 | 80.17387 |
| හල්මිල්ලෑව වැව | තෝරව | 25 | භාවිතයට ගනු ලැබේ | 15 | 32 | 23.75 | 7.966737 | 80.16333 |
| පන්සල් වැව (පින් වැව) | තෝරව | 25 | භාවිතයට ගනු ලැබේ | 15 | 01 | 10.00 | 7.966913 | 80.17965 |
| මුළු එකතුව | | 180 | | 130 | 221 | 147.5 | | |

1.2.2. එල්ලංගාවට අයත් වැව් ආශ්‍රිත භූමි පරිභෝජනය සම්බන්ධ තොරතුරු

වගු අංක 04 - එල්ලංගාවට අයත් වැව් ආශ්‍රිත භූමි පරිභෝජනය සම්බන්ධ තොරතුරු

| වැවේ නම | වැවට අදාළ මුළු භූමි ප්‍රමාණය (හෙක්ටයාර) | වගා කරනු ලබන භූමි කුඹුරු ප්‍රමාණය (හෙක්ටයාර ) | | නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්) | | වගාකරනු ලබන පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| | | යල කන්නය | මහ කන්නය | යල කන්නය | මහ කන්නය | |
| මහතෝරව වැව | 27.00 | 16 | 45 | 24 | 67.50 | 138 |
| උඩතෝරව වැව | 10.29 | 07 | 35 | 20 | 46.00 | 50 |
| හල්මිල්ලෑව වැව | 5.00 | 10 | 30 | 15 | 45.00 | 32 |
| අළුත්තෑව වැව | 4.00 | 0 | 7 | 0 | 10.20 | 05 |
| මයිලෑව වැව | 4.00 | 0 | 6 | 0 | 09.00 | 14 |
| කුඹුක්කඩවල වැව | 7.5 | 0 | 11 | 0 | 16.50 | 4 |
| ඉහල කෝන්වැටිය වැව | 2.5 | 0 | 14 | 0 | 21.00 | 8 |
| පින් වැව(පන්සල් වැව) | 4.4 | 0 | 7 | 0 | 10.50 | 01-(14) |
| එකතුව | 64.69 | 33 | 155 | 59 | 225.70 | 252 |

මූලාශ්‍රය - දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම සැලැස්ම

1.2.3. එල්ලංගාවට අයත් ප්‍රතිසංස්කරණය කරන ලද වැව් 04 ට අදාළ භූමි පරිභෝජනය සම්බන්ධ තොරතුරු

වගු අංක 0 5 - එල්ලංගාවට අයත් වැව් ආශ්‍රිත භූමි පරිභෝජනය සම්බන්ධ තොරතුරු

| වැවේ නම | මුළු භූමි ප්‍රමාණය (හෙක්ටයාර) | වගා කරනු ලබන භූමි කුඹුරු ප්‍රමාණය (හෙක්ටයාර ) | | නිෂ්පාදනය (මෙට්‍රික් ටොන් ) | | වගාකරනු ලබන ගොවීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| | | යල කන්නය | මහ කන්නය | යල කන්නය | මහ කන්නය | |
| මහතෝරව වැව | 27.00 | 16 | 45 | 24 | 67.50 | 138 |
| උඩතෝරව වැව | 10.29 | 07 | 35 | 20 | 46.00 | 50 |
| හල්මිල්ලැව වැව | 5.00 | 10 | 30 | 15 | 45.00 | 32 |
| පින් වැව(පන්සල් වැව) | 4.40 | 0 | 7 | 0 | 10.50 | 01(14) |
| එකතුව | 46.69 | 33 | 117 | 59 | 169.00 | 221 |

මුලාශ්‍රය - දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම සැලැස්ම

### 1.2.4. එල්ලංගාව පිහිටි වසම තුළ ඇති වැව් පිළිබඳ විස්තර

වගු අංක 06 - අංක 44 තෝරව වසම තුල පිහිටි වැව් වල විස්තර

| වැවේ නම | සුළු වාරි | ජල ධාරිතාවය අක්කර /අඩි | ජලාශයේ ප්‍රමාණය (අක්කර) | පෝෂක කුඹුරු ප්‍රමාණය (අක්කර) | වගාකරන පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| කෝන්වැටිය | සුළු වාරි | 05 | 05 | 8.75 | 08 |
| මහතෝරව | සුළු වාරි | 60 | 70 | 86.00 | 138 |
| ඉහල මල් නයිදාගම | සුළු වාරි | 04 | 05 | 06.00 | 07 |
| උඩතෝරව වැව | සුළු වාරි | 40 | 60 | 27.75 | 50 |
| හල්මිල්ලෑවගම | සුළු වාරි | 15 | 25 | 23.75 | 32 |
| මයිලෑව | සුළු වාරි | 04 | 06 | 09.75 | 13 |
| ඉහල හිගුරු වැව | සුළු වාරි | 05 | 05 | 08.00 | 02 |
| පහල හිගුරු වැව | සුළු වාරි | 05 | 08 | 11.72 | 07 |
| කොකෑව වැව | සුළු වාරි | 04 | 05 | 14.02 | 08 |
| කුඹුක්කඩවල වැව | සුළු වාරි | 03 | 05 | 03.00 | 04 |
| පන්සල් වැව | සුළු වාරි | 15 | 25 | 10.00 | 01 |
| පූංගන්කුලම වැව | සුළු වාරි | 10 | 20 | 30.00 | 28 |
| එකතුව | | 170 | 239 | 238.92 | 298 |

මූලාශ්‍රය - සම්පත් පැතිකඩ ගල්ගමුව සම්පත් පැතිකඩ-2023

## 1.3. මහතෝරව එල්ලංගාව තිරසර ලෙස කළමනාකරණය කිරීමේ වැදගත්කම

ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පිහිටා ඇති මහතෝරව එල්ලංගාව වියළි කාලාපීය කාලගුණික තත්වයක් පවතින්නා වූ විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ දෙන ප්‍රදේශයක් සහිත වුවත්, එහි විවිධ සංවර්ධන විභවතාවයන් හදුනාගත හැකිය. පෞරාණික වශයෙන් වැදගත්කමක් ඇති විශාල වාරි කර්මාන්ත සහ සුළු පරිමාණ කර්මාන්ත විශාල සංඛ්‍යාවක් ප්‍රදේශය පුරා ව්‍යාප්ත ව ඇත. වර්තමානයේ ඉදිකෙරෙන වාරි කර්මාන්තද මේ අතර වේ. මෙම ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ ප්‍රධාන ජීවනෝපය මාර්ගය ගොවිතැන වේ. ගොඩ ගොවිතැන ලෙස එළවළු, පළතුරු, ධාන්‍ය වගාව බහුලව දැකිය හැක. ප්‍රදේශයේ පවතින වර්ෂා රටාව අනුව කුඹුරු ඉඩම් ද කාලීනව ගොවිතැන සඳහා යොදා ගැනේ. වගා කලහැකි විශාල ඉඩම් ප්‍රමාණයක් විවිධ හේතූන් නිසා වගා නොකිරීමද ප්‍රදේශයේ පවතින ගැටළුවකි. එයට ප්‍රධානතම හේතුව ජලය ප්‍රමාණවත් පරිදි නොතිබීමයි.

දේශගුණ සුහුරු ව්‍යාපෘතිය යටතේ සංවර්ධන කටයුතු සඳහා ප්‍රදේශ තෝරාගැනීමේ ප්‍රධාන නිර්ණායකයක් ලෙස අධික උණුසුම් සහිත ප්‍රධාන ජීවනෝපය ලෙස ගොවිතැන සිදුකරන ප්‍රදේශ තෝරාගනු ලබයි. මහතෝරව එල්ලංගාවේ වැව් 04 න් දල වශයෙන් අක්කර 147.05 ක පමණ වන භූමි ප්‍රමාණයක වී වගා කරනු ලබයි. එමගින් ප්‍රතිලාභ ලබන ගොවී පවුල් සංඛ්‍යාව 221ක් පමණ වේ. දැනට මෙම ප්‍රයෝජනයට ගන්නා වැව් හතරේ ජල ධාරිතාවය අක්කර අඩි 130 පමණ වන අතර යල සහ මහ කන්න වල වී වගා කරන භූමි ප්‍රමාණය හෙක්ටයාර 150 ක් පමණ වේ. මෙම ප්‍රදේශයේ වී නිෂ්පාදනය ආසන්න වශයෙන් මෙට්‍රික් ටොන් 228 පමණ වේ.

දේශගුණ සුහුරු ව්‍යාපෘතිය යටතේ ප්‍රතිසංස්කරණය කිරීමෙන් අනතුරුව මෙම වැව් වල ධාරිතාවය අක්කර අඩි ............ දක්වා ඉහළ නැංවෙන අතර ඒ අනුව යල හා මහා කන්න දෙකේ වගාකිරීමට අපේක්ෂිත භූමි ප්‍රමාණය හෙක්ටයාර 158 ක් පමණ වන අතර වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 250 ක් දක්වා ඉහළ නැංවීමට බලාපොරොත්තු වේ.

මෙසේ සාමාන්‍ය ජන ජීවිතයට සෘජුව බලාපන මෙම එල්ලංගා පද්ධතිය විවිධ මානව හා පාරිසරික ක්‍රියාකාරකම් හේතුවෙන් පරිහානියට පත්වෙමින් පවති. ප්‍රධාන වශයෙන්ම අනවසර වගාකිරීම හා හේන් වගාව සඳහා වනාන්තර විනාශ කිරීම හා ජල පෝෂක ප්‍රදේශ වල සිදුකරන මහා පරිමාණ වගා කිරීම් ආදිය නිසා සිදුවන පාංශු ඛාදනය වැනි හේතු මත වැව් ගොඩවීමත්, නිසි නඩත්තුවක් නොමැතිවීමෙන් ඇළ වේලි විනාශ වීම හේතුවෙන් ජල කළමනාකරණය දුර්වල වීමත්, වැව් ආශ්‍රිතව අතීතයේ සිට පැවතිය යුතු ප්‍රධාන අංග විනාශ වීමත් වැනි කරුණු හේතුවෙන් මෙම එල්ලංගා පද්ධතිය පරිහාණියට පත්වෙමින් ඇත.

පන්සල් වැව (පිං වැව) ඉස්මත්තේ (DELMO FARM @ INFINITY AGRO) ආයතනය අක්කර 100 ක් පමණ 99 බද්දට අඹ වගාවක් සිදුකර ඇත. මීට අමතරව මඤ්ඤොක්කා වගාවක්ද සිදුකර ඇත. එල්ලංගාවේ වැවක් වන තෝරව වැව ආශ්‍රිතව සිදුකරන අනවසර වගාවන් (කෙසෙල්, වී, පොල් ආදි විවිධ බෝග අක්කර 03 ක පමණ වපසරියක් තුළ වගාකර කර ඇත). හේතුවෙන් විශාල ලෙස පාංශු ඛාදන තත්ත්වයක් සිදුවන බවක් දක්නට ඇත. වැවට අදාල සීමා මායිම් තුළ අනවසර ලෙස පදිංචි වී විවිධ වගාවන් සිදුකරන බවක් දක්නට ඇත. තවද එල්ලංගාවට අදාල වැව් දෙකක් වන හල්මිල්ලෑව (අක්කර 3 ක පමණ) හා උඩතොරව යන වැව් ආශ්‍රිතවද අනවසර වගාවන් බහුල ලෙස සිදුකරයි. මෙම කරුණු හේතුවෙන් ජල පෝෂක ප්‍රදේශය විනාශයට පත්වන අතර පාංශු ඛාදනය තත්ත්වය හේතුවන් රොන් මඩ තැන්පත් වීම හේතුවෙන් වැවේ අල්ලන ජල ධාරිතාවය පහල යාමට හේතු වී ඇත. අනාගතයේදී මෙම ප්‍රදේශයේ ජල අර්බුදයක් ඇති වීමටද නිතැතින්ම මෙය හේතුවනු ඇත.

තවද, වන අලි තර්ජනය, සැලසුම් නොකළ භූමි පරිභෝජනය, කෘෂි කර්මාන්තයේදී අධික රසායනික පොහොර හා කෘමිනාශක භාවිතය ඒවා ජලාශවලට බැහැර කිරීම, නාගරික අපද්‍රව්‍ය ජලාශ වලට බැහැර කිරීම වැනි හේතූන්ද එල්ලංගාවේ තිරසර පැවැත්මට අහිතකර ලෙස බලපායි. මේ හේතුවෙන් එල්ලංගා පද්ධතිය මගින් බලාපොරොත්තු වන ඵලදායිතාවය පහළ යමින් පවතී.
මෙම තත්ත්වය මග හරවා ගැනීමට නම් මනා කළමනාකරණයකින් යුක්තව එල්ලංගාව හා සම්බන්ධ වන සියලු පාර්ශවයන්ගේ සහභාගීත්වයෙන් යුතු කළමනාකරණ ක්‍රියාවලියක් සකස් කිරීම අවශ්‍ය වේ. ඒ අනුව එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කර මහතෝරව එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය අවධානය යොමු කර ඇත. එහිදී එල්ලංගා කළමණාකරන කමිටුවට එල්ලංගා පැතිකඩක් හා අවසාන වශයෙන් එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කිරීමට ව්‍යාපෘතිය සහාය ලබාදේ.

කෙසේ වූවද එල්ලංගාවේ පිහිටි වැව් 08 න් 04ක් එල්ලංගා සංවර්ධන ප්‍රවේශය (Cascade Development Approach) උපයෝගී කරගනිමින් ව්‍යාපෘතිය මගින් කරනු ලබන අතර එහිදී මුළු පද්ධතියේ තිරසර පැවැත්ම තහවුරු වන ආකාරයට එල්ලංගාව සංවර්ධනය සඳහා විශේෂ අවධානයක් යොමු කරයි.

## 2. එල්ලංගා කළමණාකරන කමිටු පිහිටුවීම

එල්ලංගා පද්ධතියක් යනු අතීතයේ සිට වාරි කළමණාකරනයේදී භාවිතා කරන ලද සාම්ප්‍රදායික ජල කළමණාකරන ක්‍රමවේදයකි. එල්ලංගාව යන වචනය සිංහල භාෂාවේ වචන දෙකක් එනම්, "එල්ලන්" සහ "ගාව" යන වචන දෙක එකතු වී සකස් වී ඇත. "එල්ලන්" යනු එල්ලෙන යන්නයි. "ගාව" යනු එකකට පසු අනෙක් ඒවා යන්නයි. එල්ලංගාව යන වචනයේ අදහස වනුයේ ඉහල සිට පහලට එකිනෙකට සම්බන්ධිත ලඟින් පිහිටි වැව් පද්ධතියක් යන්නයි. ශ්‍රී ලංකාවේ මෙම වාරි තාක්ෂණ එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් ලෝක උරුමයක් ලෙසද නම් කර ඇත. එල්ලංගා

කළමණාකරන කමිටු පිහිටුවීමේ අදහස වනුයේ දශක කිහිපයකට පෙර පැවති ලෙස එල්ලංගාව පවත්වාගෙන යාම සඳහා එල්ලංගාවට කළමණාකරන සම්බන්ධිත සියලුම පාර්ශවකරුවන් පොදු සංසදයක් ලෙස වැඩ කර එල්ලංගාව ආරක්ෂා කිරීමට කටයුතු කිරීමයි. එසේම එල්ලංගා කළමණාකරන කමිටු නීතිගත කිරීමටද අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි. පරිපාලන දිස්ත්‍රික්ක 11ක අදාල ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටු වල සහාය ඇතිව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 06/2023 දරන චක්‍ර ලේඛය අනුව (ඇමුණුම 01) එල්ලංගා කළමණාකරන කමිටු 54ක් පිහිටුවීමට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වේ. ලෝක බැංකු මූල්‍ය ආධාර මත කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ අදාල පාර්ශවකරුවන් සමඟ සමීපව කටයුතු කර එල්ලංගා කළමණාකරන කමිටු 54 පිහිටුවීමේ සමස්ථ ක්‍රියාවලිය සඳහා  සහාය ලබාදේ.

එල්ලංගා කළමණාකරන කමිටු සාමාජිකත්වය පහත ආයතන නියෝජිතයින්ගෙන් සමන්විත වේ. ඒවා නම්,

1. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
2. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව
3. පළාත් සහ අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
4. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
5. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
6. ප්‍රාදේශීය ලේකම් කාර්යාල
7. ගොවි සංවිධාන
8. ප්‍රජා මූල සංවිධාන
9. ජල සම්පත් මණ්ඩලය
10. ආපදා කළමණාකරන කාර්යාංශය
11. පොලිස් දෙපාර්තමේන්තුව
12. ජාතික ජලජ ජීවී සංවර්ධන අධිකාරිය
13. මධ්‍යමපරිසර අධිකාරිය
14. පෞද්ගලික අංශය
15. ඉඩම් පරිහරණ සැලසුම් දෙපාර්තමේන්තුව යන ආයතන වේ.

එල්ලංගා කළමණාකරන කමිටුවක මූලික වගකීම වනුයේ එල්ලංගාව ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා උපාය මාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීමයි. රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශය , ප්‍රජා මූල සංවිධාන ඇතුලු පාර්ශවකරුවන් රාශියකට එල්ලාංගාව ආරක්ෂා කිරීමේ හා කළමනාකරණ කිරීමේ වගකීම පැවරී ඇති අතර ප්‍රධාන පාර්ශවකරුවන් පහත රූප සටහන් අංක  03 මගින් දක්වා ඇත.




රූපසටහන 03 - එල්ලංගා පද්ධති කළමණාකරනය සඳහා වර්තමානයේ සම්බන්ධිත ප්‍රධාන ආයතන

## 2.1. එල්ලංගා කළමණාකරන කමිටුවක අවශ්‍යතාවය

එල්ලංගාවක්, ජල පෝෂක ප්‍රදේශයේ මතුපිට මෙන්ම භූගත ජල මට්ටම සුරක්ෂිත කරන අතර එහි ප්‍රතිපලයක් ලෙස ජනතාවට ආහාර පිසීම වැනි ගෘහ කටයුතු සහ වගා කටයුතු වලට ජලය සපයනු ලබයි. රූප සටහන් අංක 02 අනුව රාජ්‍ය, පෞද්ගලික සහ ප්‍රතිලාභී පාර්ශවකාර ආයතන එල්ලංගාව ආරක්ෂා කරනු ලබයි. එසේ වූවද අංක 3 කොටසේ සඳහන් පරිදි නියමිත ලෙස පාර්ශවකරුවන්ගේ අවධානය යොමු නොවීම සහ ස්වාභාවික සහ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් එල්ලංගාව දැඩි ලෙස පරිහානියට පත්ව ඇත. එල්ලංගාව ආරක්ෂාව කිරීම සඳහා පාර්ශවකරුවන් සම්බන්ධ වීමට වඩාත් යෝග්‍ය ආයතන ව්‍යුහයක් නොමැති වීම නිසා එල්ලංගාව තව දුරටත් හානියට ලක් විමේ ප්‍රවනතාවක් පවතී. එම නිසා එල්ලංගා කළමනාකරණ කමිටුව වැනි සම්බන්ධීකරණ ආයතනයක් එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමට වඩාත් අවශ්‍ය වී ඇත.

මෙරට ඒකාබද්ධ කළමණාකරණ වැඩ සටහන් කිහිපයක් ක්‍රියාත්මක වෙමින් පවතී. ඉන් මහ වැලි ව්‍යාපාරය හා ඉන්මාස් වැඩසටහන ප්‍රමුඛතාවය ගනී . මෙම වැඩසටහන් ජලය හා බැඳුනු මහා වාරිමාර්ග පදම් කරගත් ව්‍යාපාර වේ. මෙම වැඩ සටහන් අතුරෙන් 1984 ආරම්භ වූ ඉන්මාස් වැඩ සටහන (මහා වාරිමාර්ග පුණරුත්ථාපන වැඩ සටහන MIRP හා වාරිමාර්ග පද්ධති කළමනාකරණ වැඩ සටහන් ISMP ව්‍යාපෘති ) වැදගත් තැනක් ගනු ලබන්නේ එයද ලෝක බැංකු වේ අනුග්‍රහයෙන් මෙරට ක්‍රියාත්මක වී අද දක්වාම සාර්ථකව ක්‍රියාත්මක වන බැවිනි. මෙරට මහ ගොවි ජනපද ව්‍යාපාර වල ගොවි සංවිධාන පිහිටුවීමේ ආරම්භක පියවරක් ගනු ලැබුවේ මෙම ඉන්මාස් වැඩ සටහන තුලින්ය. මෙම ගොවි ජන පද ව්‍යාපාර කළමනාකරණය කිරීම ව්‍යාපාර කළමනාකරණ කමිටුව මගින් සිදු වේ. මෙම එල්ලංගාව කළමනාකරණය කිරීම ද එල්ලංගා කළමනාකරණ කමිටුව මගින් කිරීමට ලෝක බැංකුව අපේක්ෂා කරයි. ඉහතින් කියවෙන ව්‍යාපාර කළමනාකරණ කමිටුව හා මෙම එල්ලංගා කළමනාකරණ කමිටුව බොහෝ දුරට සමානකම් දක්වයි. මෙහි කළමනාකාරිත්වය රජයේ නිලධාරින්ගේ හා එල්ලංගාවේ ප්‍රතිලාභීන් හවුල් කරගෙන හවුල් කළමනාකරණයක් දක්වා ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කරයි. ඉහත අංක දරණ ජේදයට අනුව මෙම එල්ලංගා කළමනාකරණ කමිටුවේ අන්තර්ගතය සටහන් කර ඇත. ඉතා වේගවත්ව හායනයට යමින් පවතින ලෝක උරුමයක් ලෙස හඳුනාගෙන ඇති එල්ලංගාව නැවතත් තිරසරව පවත්වාගෙන යාමට මෙම එල්ලංගා කළමනාකරණ කමිටුව බෙහෙවින් ඉවහල් වනු ඇත.

## 2.2. එල්ලංගා පැතිකඩක් සකස් කිරීමේ අවශ්‍යතාවය

එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා අතීතයේ පැවති සාම්ප්‍රදායික ග්‍රාමීය ආයතන ව්‍යුහය හා සමාජ ආර්ථික වත් පිලිවෙත්, සම්ප්‍රදායන් හා චාරිත්‍ර වාරිත්‍ර නිසා එල්ලංගාවේ තිරසර පැවැත්ම තහවුරු වූ අතර ක්‍රමානුකූලව මෙම තත්වයන් වෙනස් වීමත් සමග එල්ලංගා පද්ධතිය හායනයට පත් විය. වර්තමානය වන විට එය ඉතාමත් වේගයෙන් හායනයට ලක් වෙමින් පවතී. එල්ලංගා පද්ධති නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමේදී, සම්පත් හායනය වලක්වා ගැනීමේදී හා මනා කළමණාකරනයක් කිරීමේදී එල්ලංගාවේ වර්තමාන තත්වය සහ පවතින ගැටළු හා ඒවා අතර ඇති වඩාත් උග්‍ර ගැටළු හඳුනා ගැනීම ඉතාමත් වැදගත් වේ. මේ සඳහා එල්ලංගාවේ භූගෝලීය ගැටළු, ජල විද්‍යාත්මක ගැටළු, පරිසර විද්‍යාත්මක ගැටළු හා සමාජ ආර්ථික ගැටළු හඳුනා ගත යුතු වේ. එසේම එල්ලංගාව තුල වර්තමානයේ සිදුවන මානව ක්‍රියාකාරකම් පිලිබඳව, විවිධ ක්‍රමවේද ඔස්සේ එනම් හරස්කඩ චාරිකා, ද්විතීය දත්ත සහ කුඩා කණ්ඩායම් සාකච්ඡා මගින් තොරතුරු එකතු කර එල්ලංගා පැතිකඩක් සකස් කරනු ලබයි. මෙම එල්ලංගා පැතිකඩ එල්ලංගා පද්ධති කළමණාකරනයේදී මූලික අවශ්‍යතාවයකි.

## 2.3. එල්ලංගා පැතිකඩක් සකස් කිරීමේ දී අනුගමනය කල ක්‍රමවේදය

මහතෝරව එල්ලංගා පැතිකඩ සකස් කිරීම සඳහා මූලාශ්‍ර කිහිපයක් ඔස්සේ තොරතුරු ලබාගන්නා ලදී.

- හරස්කඩ චාරිකා
- ද්විතීය දත්ත
- කණ්ඩායම් සාකච්ඡා

ඒ අතර ප්‍රධාන වූ අතර ද්විතීය දත්ත ලෙස ව්‍යාපෘතියේ සංවේදී කලාප සඳහා සකස් කරන ලද කෘෂිකාර්මික සංවර්ධන සැලැස්ම, ඉංජිනේරු සමීක්ෂණය, ජල විද්‍යාත්මක තක්සේරුව හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තු වලින් ලබා ගත් තොරතුරු භාවිතා කරන ලදී.

මීට අමතරව ප්‍රාථමික දත්ත ජනනය කිරීම සඳහා හරස්කඩ චාරිකාවක් ද (Transect Walk) සියලු පාර්ශවකාර සංවිධාන වල සහභාගීත්වයෙන් සිදුකරන ලදී. එල්ලංගාවේ ප්‍රධාන ජල පෝෂක ප්‍රදේශ එනම්, මහතෝරව, උඩ තෝරව, හල්මිල්ලෑව යන වැව් හා අවසන් වැව වන පන්සල් වැව යන වැව් පිලිබඳව 2024.08.27 දින පැවැති හරස්කඩ චාරිකාවේ දී තොරතුරු ලබාගන්නා ලදී. මේ සඳහා කණ්ඩායම් 04 ක් පහත පරිදි යොදවා තොරතුරු රැස් කරන ලදි.

වගු අංක 07- හරස්කඩ චාරිකා පිළිබඳ තොරතුරු

| දිනය | 2024-08-27 | | |
|---|---|---|---|
| කණ්ඩායම | ආවරණය කරන ලද ප්‍රදේශය | ආරම්භක ස්ථානය | සහභාගී වූ සාමාජිකයන් ගණන |
| 01 | මහතෝරව වැව | මහතෝරව වැව | 10 |
| 02 | උඩතෝරව වැව | මහතෝරව වැව | 10 |
| 03 | හල්මිල්ලෑව වැව | මහතෝරව වැව | 10 |
| 04 | පන්සල් වැව | මහතෝරව වැව | 10 |

සාමාන්‍යයෙන් අතීතයේදී හරස්කඩ චාරිකාවේදී ගමන් මාර්ගයේ මීටර් 100 න් 100ට තොරතුරු ලබාගත්තද එල්ලංගා පද්ධතියක් සමාන්තර රේඛාවක නොපිහිටන බැවින් (විසිරී පවතින බැවින්) එල්ලංගාවේ වැව් වල පිහිටීම අනුව එල්ලංගාවේ භූමි ප්‍රමාණය කොටස් වලට වෙන් කර එම කොටස් අනුව කණ්ඩායම් කර බහුඅශ්‍ර ක්‍රමයට තොරතුරු රැස්කරන ලදී. එහිදී අදාළ ප්‍රදේශයේ භූගෝලීය තොරතුරු, භූවිද්‍යාත්මක තොරතුරු, ජල විද්‍යාත්මක තොරතුරු, පරිසර විද්‍යාත්මක තොරතුරු, සමාජ ආර්ථික තොරතුරු, සම්පත් හායනයේ බරපතලකම පිළිබඳව නිරීක්ෂණ හා සාකච්ඡා මගින් තොරතුරු එකතු කරගන්නා ලදී. හරස්කඩ චාරිකාව සඳහා ප්‍රතිලාභීන්, ගොවි සංවිධාන සාමාජිකයින් හා සියලු රාජ්‍ය ආයතන වල නිලධාරීන් සහභාගීවූ අතර චාරිකාවෙන් එක්රැස් කරගන්නා ලද තොරතුරු වල වලංගුභාවය තහවුරු කර ගැනීම සඳහා 2024-09- දින නැවත ඊට අදාළ සියලු පාර්ශව වල සහභාගීත්වයෙන් දී සාකච්ඡාව මහතෝරව වැව ආශ්‍රිත නිවසක පවත්වන ලදී.



මින්

විශේෂයෙන්ම මෙම එල්ලංගා පැතිකඩේ ඇති තොරතුරු එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම සැකසීම සඳහා ඉතාමත් වැදගත් වන අතර එල්ලංගාව අධ්‍යයනය කරනු ලබන අයට එල්ලංගාව පිළිබඳව තොරතුරු ලබාගැනීමේ දී සහ එල්ලංගාවේ ඉදිරි සංවර්ධන කටයුතු සැලසුම් කිරීමේදී බෙහෙවින් ඉවහල්වනු ඇත.

## 2.4. එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කිරීමේ අරමුණු

එල්ලංගා පද්ධතියේ සම්පත් ආරක්ෂා කිරීම සහ ඒවායේ තිරසර පැවැත්ම තහවුරු කිරීම සඳහා එල්ලංගා කළමණාකරන වැඩසටහනක් දැඩි ලෙස අවශ්‍ය වී ඇත. එසේම එල්ලංගාවේ සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය ඇතිව සුදුසු ආයතන ව්‍යුහයක් හරහා ඒකාබද්ධව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගාව කළමණාකරනය කල යුතුවේ. ඒ සඳහා පහත අරමුණු ඉටු කර ගැනීම සඳහා එල්ලංගා පැතිකඩ සහ කළමණාකරන සැලැස්ම සකස් කරනු ලබයි.

2.4.1. ප්‍රධාන වශයෙන් භූගෝල විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, බෝග වගා රටාවන් සහ මානව ක්‍රියාකාරකම් නිසා එල්ලංගා පද්ධතියට වන හානි පිලිබඳ තොරතුරු සහ භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) උපයෝගී කරගෙන සකස් කරන ලද සිතියමක්ද, ඇතුලත් විස්තරාත්මක එල්ලංගා පැතිකඩ(Cascade Profile) පාර්ශවකාර සංවිධාන වල ප්‍රයෝජනය සඳහා සැකසීම මගින් පාර්ශවකාර සංවිධාන වලට එල්ලංගාව සුරැකීමට පහසුකරණය කිරීම.

2.4.2. එල්ලංගා පද්ධතියේ වඩාත් උග්‍ර ගැටළු විසඳීම සඳහා වන උපායමාර්ගික මැදිහත්වීම්, ඒ සඳහා වන දල වියදම් ඇස්තමේන්තු, කිරීමේ කාලවකවානු සහ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා මැදිහත්විය යුතු පාර්ශවකාර ආයතන යන මූලිකාංග ඇතුලත් එල්ලංගා පද්ධති කළමණාකරන මූලික සැලැස්මක් (Cascade Management Plan)සැකසීම.

2.4.3. එල්ලංගා පද්ධතියේ වඩාත් උග්‍ර ගැටළු සහ ඒවා මගින් එල්ලංගා පද්ධතියට සිදු වී ඇති සහ සිදුවෙමින් පවතින හානි පිළිබදව ප්‍රතිපත්ති සම්පාදකයින් හා පාර්ශවකරුවන් දැනුවත් කිරීම.

### එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කලමණාකරන මූලික සැලැස්ම සැකසීමේ වැදගත්කම

එල්ලංගා පැතිකඩ, ස්වාභාවික හා මානව ක්‍රියාකාරකම් නිසා එනම් වර්ෂාව අඩු වීම, අවිධිමත් හේන් වගාව, වනාන්තර එලිපෙහෙලි කිරීම, සත්ව පාලන කටයුතු, කැලි කසල බැහැර කිරීම, පස් කැපීම, පතල් කැපීම සහ වැව් ආශ්‍රිත පරිසර පද්ධතිය විනාශ කිරීම යනාදී හේතු නිසා එල්ලංගාව හානියට පත්වී ඇති ආකාරය, එහිදි පාර්ශවකරුවන් වගකිව යුතු ක්ෂේත්‍ර හා ඔවුන්ගේ වගකීම් පිලිබඳව විවිධ මානයන් ඔස්සේ පාර්ශවකරුවන් හා ගොවි ප්‍රජාව අතර තොරතුරු හුවමාරු කරගැනීම සඳහා බෙහෙවින් ඉවහල් වේ. එල්ලංගා පැතිකඩ ප්‍රතිපත්ති සම්පාදකයින්ට, ප්‍රාදේශීය දේශපාලකයින්ට, පාර්ශවකාර ආයතන වලට සහ ගොවි ප්‍රජාවට එල්ලංගාව පිලිබඳව නිවැරදි අවබෝධයක් ලබා ගැනීමට සහ එල්ලංගාව ආරක්ෂා කර ගැනීම සඳහා නිවැරදි තීරණ ගැනීමට තවදුරටත් වැදගත් වේ. එල්ලංගා පද්ධතිය ආරක්ෂා කර ගැනීමට සාමූහිකව හා සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කළමණාකරන මූලික සැලැස්මක් සැකසීම(Cascade Management Plan) සඳහා එල්ලංගා පැතිකඩ විශේෂයෙන්ම වැදගත් වේ. මෙහි සඳහන් මූලික එල්ලංගා කළමණාකරන සැලැස්ම එල්ලංගා කළමණාකරන කමිටුව විසින් සකස් කරන ලද එල්ලංගා පැතිකඩ පදනම් කරගෙන සකස් කරනු ලබයි.

## 2.5. එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීමේ දී අනුගමනය කරන ලද ක්‍රමවේදය

දේශගුණ සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, මහතෝරව එල්ලංගාවේ පවතින තත්වය විශ්ලේෂණය කිරීමෙන් පසුව එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා සියලු පාර්ශවකාර ආයතන සම්බන්ධිත එල්ලංගා කළමණාකරන කමිටුව වැනි ආයතනයක අවශ්‍යතාවය තහවුරු විය. මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහා එල්ලංගා කළමණාකරනය සඳහා ප්‍රධාන කාර්යයක් ලෙස විද්‍යානුකූල හා සහභාගීත්ව ප්‍රවේශයකින් යුත් එල්ලංගා කළමණාකරන සැලැස්මක් අවශ්‍ය බවටද දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියට අවබෝධ විය. එල්ලංගා කළමණාකරන කමිටුවට විධිමත් එල්ලංගා පැතිකඩක් සහ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කිරීමට එය උදව්වක් විය. පිළිවෙලින් එල්ලංගාව අධ්‍යනය කිරීම හා ද්විතීය හා ප්‍රාථමික දත්ත හා තොරතුරු එකතු කිරීම, තොරතුරු ජනනය කිරීම එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ පූර්ව අවශ්‍යතාවයක් විය.

එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීම ක්ෂේත්‍ර මූලික ක්‍රියාකාරකම් ඇතුලත් බහුවිධකාර්යයකි. ඒ සඳහා එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීමට පෙර එල්ලංගා පැතිකඩ සකස් කල යුතු අතර එහිදී එල්ලංගාවේ භූවිද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, ජලවිද්‍යාත්මක, සිතියම් විද්‍යාත්මක හා සමාජ පැතිකඩ තක්සේරු කිරීම සඳහා සහභාගීත්ව හා බහුපාර්ශවීය ක්‍රමවේද භාවිතා කරනු ලබයි. දත්ත උත්පාදනය, ත්‍රිමානකරණය, දත්ත විශ්ලේෂනය, වාර්තා ලිවීම, සැලැස්ම සැකසීම සහ පාර්ශව කරුවන්ගෙන් ඒවායේ නිවැරදිභාවය තහවුරු කරගැනීම සඳහා බහුවිධ දක්ෂතා ඇති පුද්ගලයින් අවශ්‍ය වේ. මෙම සියලුම කාර්යයන් ලෝක බැංකු කාර්ය මණ්ඩලයේ උපදෙස් ඇතිව දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් විසින් ඉටුකරනු ලැබීය. එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසිම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය සහ හවුල්කාර ආයතන එකතු වී පහත ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී.

I. රැස්වීම් පැවැත්වීම.
II. ද්විතීය දත්ත එකතු කිරීම.
III. හරස්කඩ චාරිකාව වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර ප්‍රාථමික දත්ත උත්පාදනය කිරීම.
IV. එල්ලංගාව මුහුණ දෙන අභියෝග හඳුනා ගැනීම.
V. එකතු කරන ලද හා උත්පාදනය කරන ලද දත්ත හා තොරතුරු මත පුරෝකථන කිරීම.
VI. එල්ලංගා පැතිකඩ සැකසීම.
VII. ගැටළු ගස වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර උග්‍ර ගැටළු හඳුනා ගැනීම.
VIII. යුගල සැසඳීම වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර කඩිනමින් අවධානය යොමු කල යුතු උග්‍ර ගැටළු හඳුනා ගැනීම

IX. එල්ලංගා සැලැස්ම සැකසීම.

X. පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් එල්ලංගා කළමණාකරන සැලැස්මේ නිවැරදිතාවය තහවුරු කර ගැනීම.

XI. එල්ලංගා කළමණාකරන කමිටුවේ විශේෂ රැස්වීමකදී උග්‍ර ගැටළු විසඳීම හෝ අවම කිරීම සඳහා අවශ්‍ය උපායමාර්ගික සැලසුම් සකස් කිරීම.

XII. යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා කෙටිකාලීන (Short Term), මධ්‍යකාලීන (Medium Term) හා දීර්ගකාලීන (Long Term) වශයෙන් බෙදා වෙන් කරන ලද ප්‍රායෝගික කාලවකවානු තීරණය කිරීම හා දල ඇස්තමේන්තුවක් සකස් කිරීම ආදිය එල්ලංගා කළමණාකරන කමිටුවට පහසුවෙන් ක්‍රියාත්මක කිරීමට හැකිවන ලෙස එල්ලංගා කළමනාකරන සැලැස්මට ඇතුලත් කරන ලදී.

## 3. මහතෝරව එල්ලංගාවේ වර්තමාන පැතිකඩ

### 3.1. භූගෝලීය (Geographical ) තොරතුරු

ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර හා මධ්‍ය ප්‍රදේශ වල පිහිටි ග්‍රාම නිලධාරි කොට්ඨාශයක් වන මහතෝරව ග්‍රාම නිලධාරි කොට්ඨාශ තුල පිහිටා ඇති මෙම එල්ලංගාව හෙක්ටයාර 793.6ක භූමි ප්‍රදේශයක් තුල පැතිරී ඇත. භූ විෂමතාවය අනුව සලකා බලන විට සමස්ථ භූමියම තැනිතලා ස්වරුපයක් ගනි. මෙහි උන්නතාංශය මුහුදු මට්ටමේ සිට අඩි .......... පමණ මට්ටමේ පවති.

### 3.2. භූ විද්‍යාත්මක (Geological) තොරතුරු

මෙම එල්ලංගව අයත් ප්‍රාදේශීය කොට්ඨාසයේ පස පිළිබඳ සලකා බැලීමේදි ප්‍රධාන පස් වර්ගය රතු දුඹුරු පසය. මෙම රතු දුඹුරු පසේ අඩංගු වයනය හා පස් තට්ටුවල ඝනකම ප්‍රමාණය අනුව කොටස් දෙකකට බෙදේ. රතු දුඹුරු පස හා බොරළු මධ්‍යස්ථ ප්‍රමාණයකින් යුක්ත පසයි. මීට අමතරව නිම්න ආශ්‍රිතව දියළු පසද පාෂණ උද්ගතයන් හා ගල් සහිත තැනි බිම්ද දක්නට ඇත. හෙක්ටයාර 793.6 පුරා ව්‍යාප්ත වී ඇත.

සිතියම් අංක 03 - මහතෝරව එල්ලංගාව ආශ්‍රිතව පස




මූලාශ්‍රය - දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම සැලැස්ම

## 3.3. ජල විද්‍යාත්මක (Hydrological)තොරතුරු

මෙම එල්ලංගාව මී ඔය ගංගා ද්‍රෝණිය තුල පිහිටා ඇති අතර මී ඔය ගංගා ද්‍රොණිය උප ද්‍රෝණි අටකට වෙන් කර ඇත. මහතෝරව එල්ලංගාව එහි තුන්වන උප ද්‍රොණියේ පිහිටා ඇත. වියළි කලාපීය දේශගුණයක් සහිත මෙම කොට්ඨාශයට වර්ෂාව ලැබෙනුයේ මෝසම් සහ සංවහන වර්ෂා මගිනි. ඊසාන දිග මෝසම් වර්ෂාව මගින් සැප්තැම්බර් මස සිට පෙබරවාරි දක්වා වැඩි වර්ෂාපතනයක් ලැබෙන අතර ,සංවහන වර්ෂාව මාර්තු අප්‍රේල් මාස වලදී ලැබේ. වාර්ෂික වර්ෂාපතන අගයන් සැලකිල්ලට ගෙන වගා සැලැස්ම සකස් කර ගත හැක.

වගු අංක 08 - කලාපයට ලැබෙන වර්ෂාපතනය අගයන් (මිලිමීටර)

| | වර්ෂය | | |
|---|---|---|---|
| | 2021 | 2022 | 2023 |
| ජනවාරි | 100.1 | NA | 66.8 |
| පෙබරවාරි | 39.8 | 34.0 | 61.0 |
| මාර්තු | 35.5 | 48.5 | 43.2 |
| අප්‍රේල් | 86.4 | 232.6 | NA |
| මැයි | 262.3 | 17.8 | 60.9 |
| ජූනි | 38.8 | 46.4 | 2.8 |
| ජූලි | 10.8 | 118.8 | 0.0 |

| | | | |
|---|---|---|---|
| අගෝස්තු | 0.0 | 99.4 | 9.5 |
| සැප්තැම්බර් | 0.0 | 34.5 | 46.7 |
| ඔක්තෝබර් | 275.4 | 176.8 | 180.7 |
| නොවැම්බර් | 331.3 | 116.0 | 394.7 |
| දෙසැම්බර් | 92.0 | 187.5 | 192.0 |

සිතියම් අංක 05 - මී ඔය ද්‍රෝණිය තුල මහතෝරව  එල්ලංගාවේ පිහිටීම




මුලාශ්‍රය - දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම සැලැස්ම

## 3.4. පරිසර විද්‍යාත්මක(Environmental) තොරතුරු

ගල්ගමුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය තුළ වනාන්තර හෙක්ටයාර 2565.38 ක් පමණ ඇත. මහතෝරව  එල්ලංගාව අවට පිහිටා ඇති වනාන්තර ලෙස පාඩිපංචාව රජයේ කැළය ( 262ha), ඉහළ නාන්නේරිය රජයේ කැළය (100 ha), නබඩවල රජයේ කැළය (162ha), තම්මැන්නාවැටිය රජයේ කැළය (312 ha) දැක්විය හැක. වියළි විවෘත වනාන්තර හා කටු පඳුරු සහිත ලඳු කැලෑ බහුලව දැකිය හැකි වේ. මෙහි විශාල ප්‍රමාණයේ ශාක වර්ග වශයෙන් සියඹලා, මයිල, පලු, වීර, දිවුල්, කරඳ හා කුඹුක් වැනි ශාක විශේෂ බහුලව පවතී. පඳුරු වශයෙන් අන්දර හා එරමිණියා විශාල වශයෙන් බහුලව පවතී. මීට අමතරව මෙම එල්ලංගාවේ ශ්‍රී ලංකානු අලියා, දිවියන්, මුවන්, වල් මීහරකුන්, වල් ඌරන්, වඳුරන්, මොණරුන් වැනි සතුන්ද ඉත්තෑවන්, මීමින්නන් වැනි කුඩා සතුන්ද දැකිය හැක. මීට අමතරව උරග විශේෂ ලෙස තලගොයා, කබරගොයා, ගැට කිඹුලා, හැල කිඹුලන් හා සර්ප විශේෂ ලෙස නයා, පිඹුරා, පොළඟා, ඇහැටුල්ලා, වල් ගැරඬියා, අහර කුක්කා, මාපිලා, තෙල් කරවලා වැනි සතුන්ද කටුසු වර්ග ලෙස පලා කටුස්සා, ගරා කටුස්සන්, අං කටුස්සන් හා බෝදිලිමා වැනි විශේෂද හූනු විශේෂ ලෙස සුලභ

ගේ හූනන්, තිත් හූනන් හා කිඹුල් හූනන් හමුවේ. මෙම ප්‍රදේශයේ දුර්ලභ ගනයේ පක්ෂීන් විශේෂ ලෙස අළු කොහා, සිලිබිල්ලා, නිල් කිතලා, ලතුවැකියා, රත්මල් කිරලා  දැකිය හැක. තවද වඳ වී යන සත්වයින් ලෙස කැබැල්ලෑවන්, හම්බාවන් එල්ලංගාව තුල ජීවත් වේ.
වනාන්තර වලින් ලබා ගන්නා සේවාවන් ලෙස මිනිසුන් දර කඩා ගැනීමට වනය නිතර භාවිතා කෙරේ. මීට අමතරව දිවුල්, පලු, වීර වැනි පලතුරු සොයාගැනීමට මිනිසුන් වනාන්තරය භාවිතා කරයි. සත්ව පාලනයේ යෙදෙන ගොවීන් තණකොල හා අනෙකුත් සතුන්ගේ ආහාර සඳහා සතුන් වනාන්තර වලට මුදා හරී.




එල්ලංගාව තුල හේන් වගාව සහ පොල් වගාව බහුලව දක්නට ලැබෙන අතර වන අලින් සහ මොණරුන්, වල් ඌරන් සහ රිලවුන් බහුලව දක්නට ලැබේ. එල්ලංගාව තුල වගා කරනු ලබන සෑම ඉඩමකටම විදුලි වැටවල් යෙදීම නිසා සතුන්ගේ ගමනාගමනයට බාධා වී ඇති අතර මේ නිසාම අලි මිනිස් ගැටුම උග්‍ර වී ඇත. එසේම සෑම වැවකම වැව් රක්ෂිතය දක්වා වගා කර ඇති අතර මේ නිසා වැව ආරක්ෂාව සඳහා තිබූ ගස් ගොම්මන විනාශ වී ඇත.

එල්ලංගාවේ සිදුවන කෘෂිකාර්මික ක්‍රම බොහෝමයක් දැකගත හැකිය. මෙහිදී හේන් වගාවන් බහුලව සිදු වේ. මෙහිදී සිදු වන වනාන්තර එළි පෙහෙලි කිරීම් එල්ලංගාවේ පැවැත්මට දැඩි තර්ජනයක් වී ඇත. හේන් වගාවන්ට අමතරව පොල් හා අමතර බෝග වගාවන් කිහිපයක් ද නිරීක්ෂණය විය. හේන් සෑදීම සඳහා යොදා ගෙන අත්හරින ලද ඉඩම් වල ලඳු කැලෑව  බහුලව පවතින නිසා වන සතුන්ද මෙම ප්‍රදේශයේ බහුල වශයෙන් වාසය කරයි. පන්සල් වැව ආශ්‍රිතව වනාන්තර දක්නට ඇත. පන්සල් වැව තෝරව රජමහා විහාරය ආශ්‍රිතව  පිහිටා ඇත. පන්සල් වැවේ තනි පුද්ගල අයිතිය හාමුදුරුවන් සතුය. පන්සල් වැවේ ජල පෝෂක ප්‍රදේශයක් දක්නට නොලැබෙන අතර වගා කටයුතු සඳහා යොදා ගෙන ඇති බව දක්නට ලැබේ. අක්කර 100ක පමණ අඹ වගාවක් සහ අක්කර 10 ක පමණ මඤ්ඤොක්කා වගාවක් දක්නට ඇත. සාම්ප්‍රදායික වැවක තිබිය යුතු ගස් ගොම්මන, මඩවල, පෙරනය, වැව් ඉස්මත්ත වැනි ලක්ෂණයක් දක්නට නොමැත. මහතෝරව වැවේ ජල පෝෂක ප්‍රදේශ වගා කටයුතු සඳහා යොදාගෙන ඇත. වැව ආසන්නයේ අක්කර 15ක පමණ පොල්වත්තක් දක්නට ලැබෙන අතර කෙසෙල් වගාවක්ද ඇත. රක්ෂිත සීමා අනවසර වගාකරුවන් අත්පත් කරගෙන ඇත. හල්මිල්ලෑව වැවේ පෝෂක ප්‍රදේශ ලෙස වනාන්තර දක්නට ලැබුනත් අනවසර වගා කරුවන් පෝෂිත ප්‍රදේශ වල වගා කටයුතු සිදුකර ඇත.

## 3.5. එල්ලංගාව තුළ සිදුවන මානව ජීවනෝපාය ක්‍රියාකාරකම්

මහතෝරව එල්ලංගාව පිහිටා ඇත්තේ දුර්වල ජල වහනයක් සහිත පහතරට වියලි කලාපය තුල වේ. සාමාන්‍ය ජනගහනයක් පවතින මෙම ප්‍රදේශයේ ජනගහනයෙන් 51%ක් කාන්තා ජනගහනය වේ. අවුරුදු 20 - 59 අතර ජගහනය මුළු ජනගහනයෙන් 41% ක් පමණ වන අතර වයස අවුරුදු 70ට වඩා වැඩි වයස්ගත 5% ක් පමණ අය වේ. තෝරව වසමේ රැකියා නියුක්ත මුළු පිරිස 410කි. රැකියා නියුක්ත ජනගහනයෙන් වැඩිම පිරිසක් (44%) ක් පමණ කෘෂිකර්මාන්ත ආශ්‍රිතව ජීවනෝපාය සලසා ගනී. ඒ අනුව ප්‍රධාන මානව ක්‍රියාකාරකම් ලෙස ගොඩ හා මඩ ගොවිතැන හඳුනාගත හැක. හේන් වගාව සඳහා වනාන්තර එළිකිරීමත් පොල් හා කෙසෙල් වගාව සිදු කිරීමත් දක්නට ලැබෙන අතර මෙම කාලයේ දී ප්‍රදේශය තුල අලින්, වඳුරුන්, මොනරන්ගෙන් සහ ඌරන්ගෙන් වගාවන්ට වන හානිය වැඩිවීම හේතුකොටගෙන බොහෝ ගොවීන් හේන් සහ ගොඩ ගොවිතැනෙන් ඉවත්වන බව ප්‍රදේශයේ ගොවීන් පෙන්වා දෙයි. ඒ හේතුවෙන් හේන් ගොවිතැන සඳහා එළිකර අතහැරදැමූ වනාන්තර කොටස් ප්‍රදේශයේ බහුලව දක්නට ලැබේ. විශේෂයන්ම මෙම ප්‍රදේශයේ ජීවත්වන ගොවීන්ගෙන් සත්ත්ව පාලන කටයුතු තම ප්‍රධාන ජීවනෝප මාර්ගය ලෙස තෝරාගත් පිරිසක්ද ඇත.

මීට අමතරව පෞද්ගලික අංශයේ රැකියාවල රැකියා නියුක්ත පිරිසෙන් 10% ක් පමණ නිරත වේ. පතල් වැඩ, වතු වැඩ, කුලී වැඩ හා වෙල් වල වැඩ පිරිස 21.7 % ක් පමණ වේ. රැකියා නියුක්ත පිරිසෙන් 3 % ක් පමණ විදේශ රැකියා වල නිරතවේ. ස්වයංරැකියාවල නිරත පිරිස සේවා නියුක්ත පිරිසෙන් 7.56% ක් පමණ වේ. ස්වයංරැකියාවල නියුක්ත පිරිසක්ද ප්‍රදේශය පුරා ව්‍යාප්තව ජීවත්වන අතර නිම් ඇඳුම් කර්මාන්තය, පෙදරේරු කර්මාන්තය, සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන, වඩු කර්මාන්තය, කළුගල් කැඩීම වැනි කර්මාන්ත ද ජීවනෝපාය ක්‍රම ලෙස භාවිතා කරයි. මහතෝරව එල්ලංගාවේ අධ්‍යාපන මට්ටම පදනම් කරගත් සේවා වියුක්ත පිරිස 175 ක් වන අතර මින් 112 ක් ම 8 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලැබූ පිරිස වේ.

## 3.6. එල්ලංගාවේ සමාජ ආර්ථික තොරතුරු

එල්ලංගාව අයත් වන තෝරව වසම තුල පවුල් …….. සංඛ්‍යාව ක් වේ. මෙහි මුළු ජනගහනය 1019 පමණ වන අතර ඉන් 50.4% ( 514) ගැහැණු ද, 49.5% (505) පිරිමි ද වේ. මේ අතරින් වයස අවුරුදු 20ට අඩු ජනගහනය 474 ක් වන අතර වයස අවුරුදු 20 - 59 ත් අතර ජනගහනය 410ක් වේ. වයස අවුරුදු 60 හා ඉට ඉහළ ජනගහනය 135කි. මෙම ප්‍රදේශයේ සමස්ථ ජනගහනයෙන් 99% පමණම සිංහල බෞද්ධ වේ.

ප්‍රස්තාර අංක 01 - එල්ලංගාවේ ජනගහනය







ඒ අනුව ජනගහනයෙන් 46.5% වැඩි කොටසක් වයස අවුරුදු 20ට අඩු පාසල් යන වයසේ බව දක්නට ලැබේ. වැඩ කරන වයසේ ජනගහනය 40.23% මට්ටමේ පවතී. මෙම ප්‍රදේශයේ ජනතාවගේ අධ්‍යාපන මට්ටම සැලකූ විට වයස අවුරුදු පහට වැඩි ජනගහනයෙන් 1.96% පමණ පිරිසක් පාසල් නොගිය බාණ්ඩයට අයත්වන අතර අනෙකුත් සියලු දෙනා යම්කිසි අධ්‍යාපනයක් ලබා තිබේ. ඒ අතරින් 24% පමණ අ.පො.ස.(සා.පෙළ) හා ඊට ඉහළ අධයාපන මට්ටමක් ලබා තිබේ. අධ්‍යපන මට්ටම අනුව සේවා නියුක්ත පිරිස මුළු ජනගහනයෙන් 259කි. ජනගහනයෙන් 59.05% පමණ අ.පො.ස.(සා.පෙළ) මට්ටමෙන් පසුව අධ්‍යාපන ක්‍රියාවලියෙන් බැහැරවී ඇත.

ප්‍රස්තාර අංක 02 - අධ්‍යාපන මට්ටම




එල්ලංගාව තුල වැඩකළ හැකි ජනගහනයෙන් 40.23% ක් සේවා නියුක්ත වන අතර සේවා නියුක්ත අංශ පහත පරිදි විහිදී ගොස් ඇත.

ප්‍රස්තාර අංක 03 - රැකියා නියුක්තිය




ඉහත වගුව අනුව ප්‍රදේශයේ රැකියා නියුක්ත ජනගහනයෙන් වැඩි පිරිසක් කෘෂිකාර්මාන්තය තම ජීවනෝපාය සකසා ගන්නා බව පෙනී යයි.

## 3.7. එල්ලංගාවේ පවතින ඉදිකිරීම්

එල්ලංගාව තුළ වැව් 08 ක් දක්නට ලැබේ. මේ අතුරෙන් වැව් 4 ක් දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් පුනරුත්ථාපනය කර ඇති අතර ඒවා මේ වන විට ගොවි සංවිධාන වලට භාරදී ඇත. එල්ලංගාව තුළ අලි මිනිස් ගැටුම ඉතා බරපතලය. මේ සඳහා විසඳුමක් වශයෙන් අලි වැට ඉදිකර ගැනීමට ප්‍රජාව උත්සාහ දරයි. දේශගුණ සුහුරු ව්‍යාපෘතිය යටතේ මේ පිළිබඳව විශේෂ අවධානයක් යොමුකර ඇත. ප්‍රජාවගේ අවශ්‍යතාවයන් අනුව සකස්කල සැලැස්මකට අනුව අලි වැටවල් ඉදිකර දීම සිදු කරනු ලබයි. බොහෝ වගා බිම්වල උඩ පැලක් හා අලි වැටක් ඉදිකර ඇත.

ප්‍රදේශයේ ජනතාවගේ නිවාස සහ කුඩා ව්‍යාපාර ස්ථාන වලට අමතරව එල්ලංගාව තුල දක්නට ලැබෙන විශේෂ ඉදිකිරීම් ලෙස තෝරව මයිලෑව රජමහ විහාරස්ථානය, රන්තරු පෙර පාසල ආදී පොදු ස්ථාන හඳුනාගත හැක.
ප්‍රදේශයේ පානීය ජල අවශ්‍යතාවය සපුරාගැනීම සඳහා ඉදිකළ රන්දියදහරා ප්‍රජාමූල ජල යෝජනා ක්‍රමය හා මහතෝරව උදාර ප්‍රජාමූල ජල යෝජනා ක්‍රමයද හඳුනාගත හැකිය. ඊට අමතරව ගොවිතැන සඳහා අවශ්‍ය ජලය සපයා ගැනීමට කෘෂි ලිං 17ක් ද දක්නට ඇත. අක්කර 15 ක පමණ එළවළු සහ පළතුරු වගා කරනු ලබයි.

## 3.8. එල්ලංගාවේ කෘෂිකාර්මික බෝග වගා රටාව

ප්‍රදේශයේ කෘෂිකාර්මික රටාව ලෙස මහ කන්නය වැසි ජලය උපයෝගී කරගෙනද යල කන්න වැව් හා කෘෂි ළිංවල ජලය කළමනාකරනය කරමින් ද සිදු කරන අතර යල කන්නයේ වී වගාව බහුලව සිදු කරන අතර හේන් වගාවද සිදු කරයි. නමුත් යල කන්නයේ දී සමහර වැව් ආශ්‍රිතව යල බෙද්ම ක්‍රමයට වගා කටයුතු සිදු කරන අතර බොහෝ විට අතිරේක බෝග වගාව සිදු කරයි.
එල්ලංගාවට අයත් මුළු භූමි ප්‍රමාණයෙන් හෙක්ටයාර ක් ගොඩ හා මඩ ඉඩම් ලෙස වගා කටයුතු කරනු



ලබයි. මෙයින් මහ කන්නයේ දී හෙක්ටයාර 155 ක් හා යල කන්නයේ දී හෙක්ටයාර 33ක් ලෙස මඩ ඉඩම් වගා කරන අතර එයින් මහ කන්නයේ දී වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 255 ක් ද යල කන්නයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 59ක් ද වේ. දේශගුණ සුහුරු ව්‍යාපෘතිය මගින් වැව් ප්‍රතිසංස්කරණයෙන් අනතුරුව මෙම නිෂ්පාදනය මහ කන්නයේ දී මෙට්‍රික් ටොන් 265ක් ද යල කන්නයේ දී මෙට්‍රික් ටොන් 65ක් ද ලෙස ඉහළ නැංවීමට බලාපොරොත්තු වේ.
අතිරේක බෝග ලෙස බඩ ඉරිඟු, රට කජු, ලොකු ළූණු, මුං ආදියද පළතුරු ලෙස කෙසෙල් අදිය ද ඊට අමතරව පොල් වගාව ද ප්‍රදේශය පුරා දක්නට ලැබේ. මහතෝරව එල්ලංගාව යටතේ බඩ ඉරිඟු

නිෂ්පාදිත බිම් යල සහ මහ ලෙස පිලිවෙළින් හෙක්ටයාර 47 සහ 74 ලෙසද බඩ ඉරිඟු නිෂ්පාදනය මහ සහ යල මෙට්‍රික් ටොන් 67 ලෙසද හඳුනා ගැනේ. මීට අමතරව යල කන්නයේ දී රටකජු වගා කරන අතර එය හෙක්ටයාර 44.5 ක් තුල මෙට්‍රික් ටොන් 33 ක් වේ. කවුපි නිෂ්පාදනය ද සැලකිය යුතු මට්ටමකින් සිදු කරන අතර හෙක්ටයාර 22 කින් මෙට්‍රික් ටොන් 66 ක් නිෂ්පාදනය කරනු ලබයි. මීට අමතරව අක්කර 20කට වඩා වැඩි ප්‍රදේශයක පොල් වගාවද දක්නට ලැබේ. වගාවන් සඳහා මුර ක්‍රමයට ජලය සැපයේ. විශේෂයෙන් මහතෝරව වැව ආශ්‍රිතව අක්කර 05ක පමණ විශාල පොල් වගාවක් දක්නට ලැබේ. 2023/2024 දේශගුණ සුහුරු ව්‍යාපෘතිය මගින් මෙම ප්‍රදේශවල අතිරේක බෝග වගාව සඳහා රටකජු බෙදා හැර ඇත.

### 3.9. එල්ලංගාවේ වාරිමාර්ග කළමනාකරණය

පහත රට වියළි කලාපයට අයත් මෙම එල්ලංගාවේ මහ කන්නය සඳහා හොඳින් ජලය ලැබෙන අතර යල කන්නයේ දී වැව් වල පවතින ජලය මනා කළමනාකරණයකින් යුක්තව බෙදා ගැනීම තුලින් වගා කටයුතු සඳහා යොදා ගනී. බොහෝවිට මහ කන්නයේ දී වැව් ආශ්‍රිත සියලු ගොඩ මඩ ඉඩම් වගා කලද යල කන්නයේ දී යල බෙද්ම ක්‍රමය යටතේ වගා කටයුතු සිදු කරයි. විශේෂයෙන් එල්ලංගාව යටතේ ඇති ඔලගම් වැව් 04න් මහ කන්නයේ දි වගා කටයුතු සිදු කළද යල කන්නයේ දී වගා කටයුතු සිදුකිරීමට තරම් ප්‍රමාණවත් ජලය නොමැත.

ඊට අමතරව ගොඩ භෝග වගාවට සහ යල කන්නයේ දී සිදුකරන අතිරේක භෝග වගාවන්ට උපයෝගී කර ගැනීම සඳහා ප්‍රදේශය පුරා කෘෂි ළිං 17 ක් පමණ ඉදිකර ඇත. විශේෂයෙන් යල කන්නයේදී පන්සල් වැවේ සහ හල්මිල්ලෑව වැවේ ජලය කෘෂි අවශ්‍යතා සඳහා කිසිසේත්ම ප්‍රමාණවත් නොවන බවත් ප්‍රදේශවාසීන් පෙන්වා දෙන ලදි.

සාමාන්‍යයෙන් පන්සල් වැවෙන් මයිලෑව වැවටත්, මයිලෑව වැවෙන් හල්මිල්ලෑව වැවටත් ඉන්පසු උඩ තෝරව වැවෙන් මහතෝරව වැවට ජලය ලැබෙන අතර එම වැව්වලින් පිටකරන ජලය අවසන් වශයෙන් ඉගිණිමිටිය ජලාශයට වැටේ.

මෙම වැව් 04 ම සාම්ප්‍රායික වැවක තිබිය යුතු කට්ටකඩුව, කුණු ඇළ, ගස් ගොම්මන පෙරහන, ගොඩවල යන සාම්ප්‍රදායික අංගයන්ගෙන් තොර වී ඇති බව නිරීක්ෂණය විය. ප්‍රතිසංස්කරනයෙන් පසුත් මහතෝරව, හල්මිල්ලෑව, පන්සල් යන වැව් වල ඉදිකර ඇති සොරොව්වලින් ජලය කාන්දු වන බව ගොවි ප්‍රජාව දන්වන ලදි. මහතෝරව වැවේ පෝල් කැඩී ඇති බවත් වැව ගැඹුරු කලත් වැවේ ධාරිතාවය වැඩි වී නොමැති බවත් වැව් බැම්ම පුපුරා ඇති බවත් ගොවි ප්‍රජාව විසින් දන්වන ලදි. උඩතෝරව, මහතෝරව වැව, පන්සල් වැව (වාන උස මදි බැවින් වැලි කොට්ට දමා ඇත) යන වැව් වල වාන පහතින්

සකස් කර ඇති බවත් ඒ හේතුවෙන් වැවේ රඳා පවතින ජල ධාරිතාවය පහළ ගොස් ඇති බවත් එබැවින්, යල කන්නයේ දි වගාවට ලැබෙන ජලය හිඟ වන බවත් දන්වන ලදි. තවද කොන්ත්‍රාත්කරු විසින් උඩතෝරව වැවේ බැම්මට ඩී.ඒම්.රංබණ්ඩා මහතාගේ කුඹුරෙන් අවීමත් ලෙස 3/4 පමණ පස් ගෙන වැව් බැම්ම සකස් කර ඇති බවත් කුඹුරේ ඇති වූ වල නිසි පරිදි සකස් කර දෙන ලෙසත් ගොවි මහතා විසින් ඉල්ලීමක් කරන ලදි.

මහතෝරව, උඩතෝරව, හල්මිල්ලෑව යන වැව් වල ඇලවේලි පද්ධතිය විධිමත් පරිදි සකස් කර නොමැති බව නිරීක්ෂණය විය. මහතෝරව, උඩතෝරව, හල්මිල්ලෑව යන වැව් වලට වාන් ඇලක් ඉදිකර නොමැත. වැව් වල රක්ෂිත අනවසර වගා කරුවන් අත්පත් කරගෙන ඇත. මේ හේතුවෙන් පාංශු ඛාදනය අධික ලෙස සිදුවේ. වැව් මැන රක්ෂිතය වෙන්කල යුතුය. වැව්වල ජල පෝෂක ප්‍රදේශ විනාශ වී ඇත. කඩිනමින් මේ සඳහා පියවර ගත යුතුය.

විශේෂයෙන්ම උඩතෝරව වැවේ වැව් බැම්ම හරහා ගිය පාර හරහා වාන විධිමත් පරිදි ඉදිකර නොමැති බැවින්, මෙම මාර්ගයේ ගමන් කිරීම අපහසු වී ඇත. ගොවිජන සංප්‍රතිසංස්කරනයෙන් පසුත් එල්ලංගාවේ වාරි කළමණාකරනය නිසි පරිදි සිදු වූ බවක් දැකිය නොහැකි බව නිරීක්ෂණය විය.



## 4. මහතෝරව එල්ලංගාව මුහුණදෙන මූලික අභියෝග හඳුනා ගැනීම

### 4.1. එල්ලංගාව මුහුණදෙන ප්‍රධාන අභියෝග

මහතෝරව එල්ලංගාව සම්බන්ධයෙන් සිදුකල හරස්කඩ චාරිකා මගින් හා එල්ලංගා කළමනාකරණ කමිටු මගින් හඳුනාගත් එල්ලංගාවට සම්බන්ධ ගැටළු පහත පරිදි වේ.

01. සාම්ප්‍රදායික වාරි පරිසර පද්ධතියක තිබිය යුතු මූලික අංග සම්බන්යෙන් ගැටළු ඇතිවීම.

1.1.කට්ට කඩුව නොමැතිවීම හා කට්ට කඩුවේ ගස් නොමැතිවීම.

1.2.පෙරහන ( උස්වැටිය ) නොමැති වීම.

1.3.පිටවාන හා වාන් ඇළ සම්බන්ධ ගැටළු.

1.4.සොරොව්ව සම්බන්ධ ගැටළු.

1.5. ඇළවේලි විධිමත් නොවීම.

1.6.ගොඩවල නොමැති වීම.

1.7.වැව් බැම්ම සම්බන්ධ ගැටළු.

1.8.කුණු ඇළ නොමැති වීම.

02. ආක්‍රමණික ජලජ ශාඛ පැතිරීම.

03. පාංශු ඛාදනය හේතුවෙන් වැව්වල රොන්මඩ තැන්පත් වී වැව් ගොඩවීම.

04. ජල පෝෂක ප්‍රදේශයේ වගා කිරීම හේතවෙන් ජල පෝෂක ප්‍රදේශය සීමා වීම.

05. නඩත්තු කටයුතු ක්‍රමවත්ව සිදු නොකිරීම.

06. වන සතුන්ගෙන් සිදුවන හානි.

07. ගොවි සංවිධාන වලින් අපේක්ෂිත කාර්යයන් අපේක්ෂිත මට්ටමින් සිදු නොවීම.

මහතෝරව එල්ලංගාව මුහුණදෙන ප්‍රධාන අභියෝග හඳුනා ගැනීම එල්ලංගා පැතිකඩ හා එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීමේ ක්‍රියාවලියේ එක් ප්‍රධාන කාර්යයකි. දේශගුණික සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන පළාත් 6ක දිස්ත්‍රික්ක 11ක එල්ලංගා පද්ධති 57 ආවරණය වන පරිදි එල්ලංගා කළමණාකරන කමිටු 54ක් පිහිටුවීමට පහසුකරනය කිරීමෙන් පසුව, ව්‍යාපෘතියේ ඊළඟ කාර්යය වී ඇත්තේ සෑම එල්ලංගා කළමණාකරන කමිටුවක් සඳහාම එල්ලංගා පැතිකඩක් සහ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කර දීමට එල්ලංගා කළමනාකරණ කමිටුවට සහාය වීමයි. එල්ලංගාව සහ එල්ලංගාව මුහුණ දෙන ගැටළු හඳුනා ගැනීමට එල්ලංගා පැතිකඩ සැකසීම අතිශයින් වැදගත් වන අතර එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා ප්‍රායෝගික එල්ලංගා කළමණාකරන සැලැස්මක් සැකසීමට එල්ලංගා පැතිකඩ ඉතා වැදගත් වේ. ඒ අනුව අභියෝග හඳුනා ගත යුතු ප්‍රධාන ක්ෂේත්‍ර තීරණය කිරීම, දත්ත එකතු කිරීම හා උත්පාදනය කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේද තීරණය කිරිම, එල්ලංගා පැතිකඩේ හා එල්ලංගා කළමණාකරන සැලැස්මේ දත්ත හා තොරතුරු ජනනය කිරීම සඳහා ආකෘති සැකසීම සම්බන්ධයෙන් දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් හා ලෝක බැංකු නිලධාරීන් එක්ව උපදේශන මට්ටමේ රැස්වීම් කීපයක්ම පවත්වන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලේඛණ පරිශීලනය කිරීමට අමතරව සහභාගීත්ව ක්‍රමවේදයක් වන හරස්කඩ වාරිකා ක්‍රමවේදය එල්ලංගාව අධ්‍යනය කිරීම සඳහා ප්‍රධාන ක්‍රමවේදයක් ලෙස භාවිතා කරන ලදී. එහිදී එල්ලංගාව හරහා වාරිකා කරමින් එල්ලංගාවේ ස්වභාවය සහ එල්ලංගාව මුහුණදෙන ප්‍රධාන අභියෝග හඳුනා ගන්නා ලදී.



මේවා එල්ලංගා කළමණාකරන සැලැස්ම සකස් කිරීමේදී භාවිතා කිරීම සඳහා එල්ලංගා පැතිකඩේ විස්තරාත්මකව දක්වා ඇත. මෙම අභියෝග තව දුරටත් විග්‍රහ කර උග්‍ර ගැටලු හඳුනා ගෙන ඒවායේ නිවැරදිතාවය තහවුරු කර ගෙන ඒවා පිලිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ, පාර්ශවකරුවන්ගේ සහ ආධාර කරුවන්ගේ කඩිනම් අවධානය යොමු කරවීමට එල්ලංගා කළමනාකරණ සැලැස්මට ඇතුලත් කර ඇත.

## 4.2. මහතෝරව හරස්කඩ චාරිකාවෙන් හඳුනාගත් ප්‍රමුඛතාගත කල ගැටලු හා යෝජිත උපාය මාගී හා සැලැස්ම

වගු අංක 07 - එල්ලංගා කළමණාකරන කමිටුව විසින් උග්‍ර ගැටළු විසඳා ගැනීම හෝ අවම කිරීම සඳහා යෝජිත ප්‍රධාන ක්‍රියාකාරකම්

| අනු අංක | උග්‍ර ගැටළුව හා ගැටළුව පවතින ස්ථාන | යෝජිත උපාය මාගී හා සැලැස්ම | මැදිහත් විය යුතු අදාල ආයතනය |
|---|---|---|---|
| 01. | සොරොව්වේ ජලය කාන්දු වීම.<br>(හල්මිල්ලැව,<br>පන්සල් වැව(ජලය කාන්දුවීම හා සොරොව්ව දෙසට යෑමට ඇති කොන්ක්‍රීට් කැටය පුපුරා ඇත.<br>මහතෝරව වැව(ජලය කාන්දු වීම හා රොඩ් එක ඇදට සකස් කර ඇත.) | I. CMC හිදී සාකච්ජා කිරීම.<br>II. තාක්ෂණික උපදෙස් ලබා ගැනීම.<br>III. කොන්ත්‍රාත්කරුවන් හා ව්‍යාපෘති නිධාරීන් සමග සාකච්ජා කිරීම .<br>IV. රුඳවුම් මුදල් මගින් ප්‍රතිපාදන සපයා ගැනීම හා කොන්ත්‍රාත් කරුවන් මගින් ඉටු කිරීම. | කොන්ත්‍රාත් කරු,<br>ගොවි සංවිධාන,<br>CSIAP,<br>ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තව,<br>පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව,<br>ප්‍රාදේශීය ලේකම්. |
| 02. | ඇළවේලි පද්ධතිය නිසි පරිදි සකස්කර නොමැති වීම.<br>(මහතෝරව වැව - කුඹුරු වලට වතුර සපයා ගත නොහැකි වීම වේල්ල යට කුඹුරු උඩින් පිහිටා ඇත.)<br>(හල්මිල්ලැව වැව - එක වේල්ලක් පමණක් සකස් කර ඇත; කුඹුරු වලට වතුර සපයා ගත නොහැක.)<br>(උඩතෝරව වැව - වේලිවල බැමි කැඩි ඇත.) | I. CMC හිදී සාකච්ජා කිරීම.<br>II. තාක්ෂණික උපදෙස් ලබා ගැනීම.<br>III. කාන්ත්‍රාත් කරුවන් හා ව්‍යාපෘති නිධාරීන් සමග සාකච්ජා කිරීම .<br>IV. රුඳවුම් මුදල් මගින් ප්‍රතිපාදන සපයා ගැනීම | CSIAP,<br>කොන්ත්‍රාත් කරු,<br>ගොවි සංවිධාන,<br>ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තව,<br>පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| | | | |

| | | | |
|---|---|---|---|
| 03. | කට්ටකඩුව නොමැතිවීම. - මීටර 2500<br>(උඩතෝරව, මහතෝරව, හල්මිල්ලෑව, පන්සල් වැව) | I. CMC හිදී සාකච්ජාවට ගැනීම.<br>II. අවශ්‍ය වැව් තෝරා ගැනීම .<br>III. ගොවීන් දැනවත් කිරීම.<br>IV. ඒකාබද්ධව කට්ටකඩුව වෙන් කිරීම.<br>V. පැල සිටවීම සඳහා ප්‍රතිපාදන සපසා දීම.<br>VI. අධීක්ෂණය. | ගොවි සංවිධාන,<br>CSIAP,<br>ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,<br>පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව,<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. |
| 04. | පිටවාන පහතින් පිහිටීම.<br>(උඩතෝරව වැව - පාර හරහා වාන ඉදිකර ඇත. වානේ සිට වැකන්දට ගොඩවන තැන උස වැඩිය. බෑවුම වැඩිය. මේ නිසා පාරේ ගමන් කරන අය අනතුරට ලක් වී ඇත. පවුල් 100ක් පමණ ගමන් කරන මාර්ගයකි. වාන උස්කර සකස් කල යුතුය.)<br>මහතෝරව වැව, පන්සල් වැව, හල්මිල්ලෑව වැවේ වාන පුපුරා ඇත. | I. CMC යට අදාළ පාර්ශව සමග සාකච්ජා කිරීම.<br>II. ක්ෂේත්‍රය පරික්ෂා කිරීම.<br>III. තාක්ෂණික උපදෙස් ලබා ගැනීම.<br>IV. රුදවුම් මුදල් මගින් ප්‍රතිපාදන සපයා ගැනීම<br>V. කොන්ත්‍රාත් කරුවන්ට පැවරීම.<br>VI. අධීක්ෂණය. | පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව,<br>CSIAP,<br>කොන්ත්‍රාත්කරු,<br>ගොවි සංවිධාන. |
| 05. | වාන් ඇළ නොමැතිවීම.<br>(උඩතෝරව - (වතුර කෙලින්ම කුඹුරු වලට ගලා යයි.),<br>මහතෝරව,හල්මිල්ලෑව,පන්සල් වැව ) | I. CMC යට අදාළ පාර්ශව සමග සාකච්ජා කිරීම.<br>II. ක්ෂේත්‍රය පරික්ෂා කිරීම.<br>III. තාක්ෂණික උපදෙස් ලබා ගැනීම.<br>IV. ප්‍රතිපාදන සපයා ගැනීම.<br>V. කොන්ත්‍රාත් කරුවන්ට පැවරීම.<br>VI. අධීක්ෂණය. | ගොවි සංවිධාන,<br>CSIAP,<br>ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,<br>පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව,<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. |
| | | | |

| | | | |
|---|---|---|---|
| 06. | වැව් බැම්ම විධිමත් නොවීම.<br>උඩ තෝරව වැව, මහතෝරව වැව (වැව් බැම්ම තලා පිඩලි ඇල්ලිය යුතුය.) | I. CMC යට අදාළ පාර්ශව සමග සාකච්ඡා කිරීම.<br>II. ක්ෂේත්‍රය පරීක්ෂා කිරීම.<br>III. තාක්ෂණික උපදෙස් ලබා ගැනීම.<br>IV. රුදවුම් මුදල් මගින් ප්‍රතිපාදන සපයා ගැනීම හා කොන්ත්‍රාත් කරුවන්ට පැවරීම.<br>V. අධීක්ෂණය. | කොන්ත්‍රාත් කරු,<br>ගොවි සංවිධාන,<br>CSIAP,<br>ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,<br>පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව. |
| 07. | වැව් බැම්ම සේදි පාංශු ඛාදනය වීම. | I. CMC හිදී සාකච්ඡාවට ගැනීම.<br>II. ස්ථාන හඳුනා ගැනීම.<br>III. පාංශු ඛාදන වැටි සැලසුම් කිරීම.<br>IV. ඇස්තමේන්තු කර අදාල ගොවීන්ට පැවරීම හා ප්‍රගතිය මැන බැලීම හා උපදෙස් ලබා දීම. | කොන්ත්‍රාත් කරු,<br>ගොවි සංවිධාන,<br>CSIAP,<br>ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,<br>පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව. |
| 08. | පෙරහන නොමැතිවීම.<br>(මහතෝරව, පන්සල් වැව, උඩතෝරව වැව, හල්මිල්ලෑව වැව) | I. CMC හිදී සාකච්ඡාවට ගැනීම.<br>II. අවශ්‍ය වැව් තෝරා ගැනීම .<br>III. ගොවීන් දැනවත් කිරීම.<br>IV. පැල සිටවීම සඳහා ප්‍රතිපාදන සපසා දීම.<br>V. අධීක්ෂණය. | CSIAP,<br>ගොවි සංවිධාන,<br>ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව. |
| | | | |

| | | | |
|---|---|---|---|
| 09. | ආක්‍රමණික ජලජ ශාඛ හේතුවෙන් වැව් ගොඩවීම. | I. CMC හිදී සාකච්ඡාවට ගැනීම.<br>II. ඇස්තමේන්තු කිරීම.<br>III. ජලය අඩුවීමත් සමග නිර්දේශිත කෘමි නාශකයක් යෙදීම.<br>IV. පවත්වාගෙන යාම. | CSIAP,<br>ගොවි සංවිධාන,<br>ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,<br>කෘෂිකර්ම දෙපාර්තමේන්තුව. |
| 10. | පාංශු ඛාදනය හේතුවෙන් වැව් ගොඩවීම.<br>(පන්සල් වැව අසල ( DELMA FARM, අක්කර 50, 60)<br>මහතෝරව වැව අසල (අක්කර 03 ක පමණ පොල් සහ කෙසෙල්)<br>උඩ තෝරව වැව (අක්කර 02)<br>හල්මිල්ලෑව) | I. CMC හිදී සාකච්ඡාවට ගැනීම.<br>II. ස්ථාන හදුනා ගැනීම.<br>III. පාංශු ඛාදන වැටි සැලසුම් කිරීම.<br>IV. ඇස්තමේන්තු කර අදාල ගොවීන්ට පැවරීම හා ප්‍රගතිය මැන බැලීම හා උපදෙස් ලබා දීම. | CSIAP,<br>ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,<br>කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,<br>ගොවි සංවිධාන. |
| 11. | කෘෂි මාර්ග නොමැතිවීම.<br>(තෝරව වැවට යන කුඹුර අයිනේ ඇති මාර්ගය ප්‍රතිසංස්කරණය - (කිලෝමීටර 2 පමණ දුරට බොරළු දමා තද කිරීම)<br>හල්මිල්ලෑව වැව (කිලෝමීටර 1 ක පමණ පාර බොරළු දමා තද කිරීම) | I. CMC යට අදාළ පාර්ශව සමග සාකච්ජා කිරීම.<br>II. ක්ෂේත්‍රය පරීක්ෂා කිරීම.<br>III. තාක්ෂණික උපදෙස් ලබා ගැනීම.<br>IV. ඇස්තමේන්තු සකස් කිරීම හා ප්‍රතිපාදන සපයා ගැනීම.<br>V. කොන්ත්‍රාත් කරුවන්ට පැවරීම.<br>VI. අධීක්ෂණය. | ගොවි සංවිධාන,<br>CSIAP,<br>ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,<br>පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය. |

| | | | |
|---|---|---|---|
| 12. | පන්සල් වැව ගැඹුරු කිරීම. | I. CMC හිදී සාකච්ඡා කිරීම.<br>II. තාක්ෂණික උපදෙස් ලබා ගැනීම.<br>III. රැඳවුම් මුදල් භාවිතයෙන් වැව ඉස්මත්තේ වැටියක් ආකාරයට සකස් කිරීම සඳහා කොන්ත්‍රාත් කරුවන් වෙත පැවරීම. | කොන්ත්‍රාත් කරු,<br>ගොවි සංවිධාන,<br>CSIAP,<br>ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. |
| 13. | වැව් වල නඩත්තු කටයුතු දුර්වල වීම.<br>(ගොවි සංවිධාන වල ක්‍රියාකාරීත්වය දුර්වල වීම) | I. වැව් සඳහා නඩත්තු සැලැස්මක් සකස් කිරීම.<br>II. ගොවි සංවිධාන වල කළමනාකරණ ක්‍රියාවලිය විධිමත් කිරීම හා ඒ පිළිබඳ අධීක්ෂණය.<br>III. වැව් නඩත්තුව සහ නඩත්තු වියදම් සපයා ගන්නා ක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම. | ගොවි සංවිධාන,<br>CSIAP,<br>ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. |
| 14. | වැව්වල සීමා මායිම් ලකුණු කර නොමැතිවීම. | i. CMC හිදී සාකච්ඡාවට ගැනීම.<br>ii. අත්‍යවශ්‍ය වැව් හඳුනා ගැනීම.<br>iii. අවශ්‍යනම් මැනීම් කටයුතු සිදු කිරීම.<br>iv. ගොවි සංවිධාන දැනුවත් කිරීම.<br>v. ඒකාබද්ධව සීමා ළකුණු කිරීම. | ගොවි සංවිධාන,<br>ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව,<br>පොලීසිය,<br>දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය,<br>මිනින්දෝරු දෙපාර්තමේන්තුව,<br>වන සංරක්ෂන දෙපාර්තමේන්තුව. |

## 4.3. මහතෝරව එල්ලංගාව සම්බන්ධයෙන් හඳුනාගත් උග්‍ර ගැටළු විසඳීම සඳහා යෝජිත ක්‍රියාත්මක සැලැස්ම

වගු අංක 08 - හඳුනාගත් උග්‍ර ගැටළු විසඳීම සඳහා යෝජිත ක්‍රියාත්මක සැලැස්ම රු.මි.8.85

| අනු අංක | උග්‍ර ගැටළුව හා ගැටළුව පවතින ස්ථාන | ඇස්තමේන්තු මුදල රු.මි. | 2024 වර්ෂය | | | 2025 වර්ෂය | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ඔක්. | නො. | දෙ. | ජන. | පෙ. | මා. | අ. | මැ. | ජුනි. | ජුලි | අ. | සැ. | ඔ. | නො. | දෙ. |
| 01. | සොරොව්වේ ජලය කාන්දු වීම. | 0.00 | | | | | | | | | | | | | | | |
| 02. | ඇළවේලි පද්ධතිය නිසි පරිදි සකස්කර නොමැති වීම. | 0.00 | | | | | | | | | | | | | | | |
| 03. | කට්ටකඩුව නොමැතිවීම - මීටර 2500 | 2.00 | | | | | | | | | | | | | | | |
| 04. | පිටවාන පහතින් පිහිටීම. | 0.00 | | | | | | | | | | | | | | | |
| 05. | වාන් ඇළ නොමැතිවීම. | 2.00 | | | | | | | | | | | | | | | |

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 06. | වැව් බැම්ම විධිමත් නොවීම. | 0.00 | | | | | | | | | | | | | | | |
| 07. | වැව් බැම්ම සේදී පාංශු ඛාදනය වීම. | 1.00 | | | | | | | | | | | | | | | |
| 08. | පෙරහන නොමැති වීම. | 0.50 | | | | | | | | | | | | | | | |
| 09. | ආක්‍රමණික ජලජ ශාක හේතුවෙන් වැව් ගොඩවීම. | 0.50 | | | | | | | | | | | | | | | |
| 10. | පාංශු ඛාදනය හේතුවෙන් වැව් ගොඩවීම. | 0.50 | | | | | | | | | | | | | | | |
| 11. | කෘෂි මාර්ග නොමැතිවීම. | 0.75 | | | | | | | | | | | | | | | |
| 12. | පන්සල් වැව ගැඹුරු කිරීම. | 1.50 | | | | | | | | | | | | | | | |

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | |
| 13. | වැව් වල නඩත්තු කටයුතු දුර්වල වීම. | 0.10 | | | | | | | | | | | | | | | |
| 14. | වැව්වල සීමා මායිම් ලකුණු කර නොමැති වීම. | 0.00 | | | | | | | | | | | | | | | |
| | එකතුව | 8.85 | | | | | | | | | | | | | | | |

## 5. ඇමුණුම්

### ඇමුණුම් අංක 01

**ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව**
**கமநல அபிவிருத்தித் திணைக்களம்**
**DEPARTMENT OF AGRARIAN DEVELOPMENT**

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. 7/3/9/CMC/2023 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2023.08.03 |

චක්‍රලේඛ අංකය - 06/2023

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

<u>එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීම හා පවත්වා ගෙන යාම.</u>
**<u>Cascade Management Committee (CMC) Establishment & Continuity</u>**

රට අභ්‍යන්තරයේ සිට මුහුදට ගලා බසින ප්‍රධාන ගංගා (Rivers) තෘතියික ජල මාර්ග ලෙසත්, එම ප්‍රධාන ගංගා වලට එකතුවන අතු ගංගා (Tributarite) ද්විතීක ජල මාර්ග ලෙසත්, එම අතු ගංගා වලට ජලය සපයන කුඩා ජල මාවත් (Small water ways) ප්‍රාථමික ජල මාර්ග ලෙසත් හැඳින්වේ. ග්‍රාමීය වැව් හා අමුණු වැඩි ප්‍රමාණයක් ප්‍රාථමික ජල් මාර්ග හරහා ඉදිකර ඇති අතර භූමිය මතුපිට ජලය ගබඩා කර පහළට ගලා යාමට සැලැස්වීමට සකස් කර ඇති වැව් ද මීට ඇතුළත් වේ.

02. මෙරට අභ්‍යන්තරයේ පවතින ප්‍රාථමික ජල මාර්ගයක් හෝ ප්‍රාථමික ජල මාර්ග ජාලයක පිහිටා ඇති, ජල විද්‍යාත්මක වශයෙන් එකට බැඳුණු කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ වැව් පද්ධති හෝ වැව් හා අමුණු පද්ධති හෝ අමුණු පද්ධති වලින් සමන්විත, මධ්‍යම ප්‍රමාණයේ ජල පෝෂක ප්‍රදේශයක් (Meso-catchment) එල්ලංගා පද්ධතිය ලෙස හැඳින්වේ.

03. ශ්‍රී ලංකාවේ එල්ලංගා පද්ධති 1166 ක් දැනට හඳුනාගෙන ඇත. මෙම එල්ලංගා පද්ධති ආශ්‍රිතව භූ විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක සහ සමාජ ආර්ථික ප්‍රගමණය උදෙසා සම්පත් භාවිතය කාර්යක්ෂමව හා තිරසරව පවත්වාගෙන යාම ඉලක්ක කරගනිමින් 1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) ආඥා පනතින් සංශෝධිත 1946 අංක 32 දරන වාරිමාර්ග ආඥා පනතේ 1 (අ) 1, 2, 3, 4 වගන්ති ප්‍රකාරව ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත පැවරී ඇති බලතල අනුව සහ උක්ත පනත යටතේ පවත්වනු ලබන දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේදී වාරි කර්මාන්ත ආශ්‍රිත වී වගාව ඇතුළු කෘෂිකර්මයට බලපාන හෝ අනුෂාංගික සියලු කරුණු සම්බන්ධව කටයුතු කිරීමට උක්ත පනතෙන් ඔබ වෙත පැවරී ඇති බලතල අනුව එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු [Cascade Management Committee (CMC)] පිහිටුවීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් කෘෂිකර්ම කමිටුවේදී සමාලෝචනය කරන ලෙසත් ඊට පහත සඳහන් කරුණු මාර්ගෝපදේශ වශයෙන් යොදාගන්නා ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

<u>3.1. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීමේ පරමාර්ථ</u>

i. එල්ලංගාවක පිහිටි සියලු ස්වාභාවික සම්පත්, එනම් පස, ජලය, වන සම්පත, ජෛව පද්ධති, ඉඩම් හා වාරිමාර්ග පද්ධති කළමනාකරණය කිරීම සඳහා ප්‍රතිලාභීන් සහ අදාළ රාජ්‍ය නිලධාරීන් ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කිරීම සඳහා ආයතනික ව්‍යුහයක් සකස් කිරීම.

ii. වාරි කෘෂිකර්මය, පශු සම්පත් කටයුතු සහ මිරිදිය ධීවර කර්මාන්තය, සඳහා ජලය සැපයීම, වන සම්පත හා වන ජීවී අවශ්‍යතා තුලනාත්මකව පවත්වාගෙන යාම, භූගත ජල මට්ටම ප්‍රශස්ත ලෙස පවත්වාගෙන යාම, ගෙවතු වගාව ඇතුළු ගෘහස්ථ ජල අවශ්‍යතාවයන් විධිමත් ලෙස කළමනාකරණය කිරීම.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත, තැ. පෙ. 537, කොළඹ 07.
கமநல அபிவிருத்தித் திணைக்களம், இல. 42, சேர் மார்கஸ் பெர்னாண்டோ மாவத்தை, த. பெ. 537, கொழும்பு 07.

iii. කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය භාවිතා කරන්නන් ඇතුළුව එල්ලංගා පද්ධතිය නඩත්තු කිරීම සඳහා ලෙනහුන් පරිශීලකයන්ගේ සහ පාර්ශවකරුවන්ගේ දායකත්වය ලබාගැනීම.

## 3.2. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීමේ අරමුණු

i. එල්ලංගා පද්ධති කළමනාකරණය හා තිරසර පැවැත්ම සඳහා නීතිමය පිළිගැනීමක් සහිත ආයතනික ව්‍යුහයක් ඇති කිරීම.

ii. එක් එක් එල්ලංගා පද්ධති වලට අදාළව එහි ක්‍රියාකාරීත්වයට හා තිරසර පැවැත්මට අදාළ වන ගැටළු හා යෝජිත විසඳුම් ඒකාබද්ධ ප්‍රවේශයකින් යුක්තව සාකච්ඡා කර නීතිමය වශයෙන් පිළිගත් ක්‍රමවේදයක් ඇති කිරීම.

iii. එල්ලංගා පද්ධතිය තුළ පිහිටි වාරි කෘෂිකාර්මික, ජල කළමනාකරණ, පාරිසරික, සමාජ ආර්ථික හා භූ විද්‍යාත්මක සාධක පද්ධතියේ මනා ක්‍රියාකාරීත්වය සඳහා අඛණ්ඩව හා සක්‍රියව පවත්වාගෙන යාමට ක්‍රමවේදයක් ඇති කිරීම.

iv. එල්ලංගා පද්ධතියේ සංවර්ධන කටයුතු වලදී, මුළු පද්ධතියට සිදුවන හායනයන් වලක්වා ගනිමින් අවශ්‍යතා නඩත්තු කිරීම, ජල සම්පත් කාර්යක්ෂමව පරිහරණය සඳහා වගා කන්න පදනම් කර ගනිමින් සැලසුම් සකස් කිරීම.

v. එල්ලංගා පද්ධතිය සඳහා ඒකාබද්ධ කෘෂිකාර්මික නිෂ්පාදන සැලැස්මක් සකස් කිරීම හා එම සැලැස්මේ ක්‍රියාත්මක තත්ත්වය පසුවිපරම කිරීම.

vi. එල්ලංගා පද්ධතියක පැවතිය යුතු අංගෝපාංග ප්‍රතිස්ථාපනය සඳහා අවශ්‍ය කටයුතු කිරීම.

vii. එල්ලංගා පද්ධති හා බැඳුනු සමාජ ආර්ථික සම්බන්ධතා ආරක්ෂා කිරීම හා ඒ පිළිබඳව පාර්ශවකරුවන් දැනුවත් කිරීම

## 3.3. එල්ලංගා පද්ධති කලමනාකරණ කමිටුවේ කාර්යභාරය

i. එල්ලංගා පද්ධතිය සඳහා වන සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම.

ii. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු සාමාජිකයන් විසින් ඉදිරිපත් කරනු ලබන ගැටලු, යෝජනා සහ සැලසුම් සඳහා විසඳුම් ලබාදීම සහ විසඳිය නොහැකි ගැටලු අදාළ වන පරිදි ප්‍රාදේශීය / දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව වෙත යොමු කර විසඳා ගැනීම.

iii. එල්ලංගා පද්ධති කලමනාකරණයට අදාල වාර්තාවක් අවස්ථානුකූලව ප්‍රාදේශීය / දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව වෙත ඉදිරිපත් කිරීම.

iv. ග්‍රාමීය වැව් එල්ලංගාවන් තුළ පිහිටි සියලුම ජල මූලාශ්‍ර හා ජල පාරිභෝගිකයින් එක්ව එල්ලංගාව අයත් මධ්‍යම ජල පෝෂක ප්‍රදේශය (Meso-Catchment) සඳහා ඒකාබද්ධ කෘෂිකාර්මික සැලැස්මක් පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම.

v. එල්ලංගාවක් තුළ කටයුතු කරන සියලුම ජල පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා අනුව ජල පෝෂක ප්‍රදේශය තුළ පවතින ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාළ තීරණ ගැනීම හා ක්‍රියාත්මක කිරීම.

vi. ස්වභාවික ආපදා, ව්‍යසන හා හානිකර මානව ක්‍රියාකාරකම් අවම කරගැනීමට හැකිවන පරිදි සියලු ජල මූලාශ්‍ර කළමනාකරණය කිරීම.

vii. එල්ලංගාව තුළ පිහිටි සියලු ජල මූලාශ්‍ර ආශ්‍රිත ජල පාරිභෝගිකයන් අතර කාර්යක්ෂම තොරතුරු සන්නිවේදන ක්‍රමයක් ස්ථාපිත කිරීම.

viii. එල්ලංගාව තුළ ඇති පරිසර පද්ධති වලට අදාළ යෙදවුම් හා නිමවුම් ප්‍රශස්ත ලෙස කළමනාකරණය සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.

ix. පවතින හා ඉදිරියේදී ඇතිවිය හැකි බවට අනාවැකි පල කරන දේශගුණික විචලනයන් සඳහා යෝග්‍ය වූ දේශගුණික සුහුරු උපායමාර්ගික සැලසුම් ක්‍රියාවට නැංවීම සහ ජල පාරිභෝගිකයන් එවැනි දේශගුණික අනුගත වීම් වලට හුරු කිරීම.

x. එල්ලංගා පද්ධතිය තුළ ජල පාරිභෝගිකයන් අතර දැනුම, ආකල්ප, කුසලතාවයන් සහ සම්පත් ඵලදායී ලෙස හුවමාරු කරගැනීම.

xi. ජල පාරිභෝගියන්ගේ ඉඩම්, ජලය හා පරිසර පද්ධතිවල ඵලදායීතාවය ඉහළ නැංවීමට කටයුතු කිරීම.

**xxvii.** වෙනත් ප්‍රජා සංවිධාන හා පරිසර සංවිධාන නියෝජනය කරමින් එක් සංවිධානයකින් එක් නියෝජිතයෙකු

3.4.2.<u>දිස්ත්‍රික් මට්ටම</u>

මෙම කමිටුව අදාල දිස්ත්‍රික්කයේ පහත නිලධරයන්ගෙන් සමන්විත වේ.

i. දිසාපති හෝ දිස්ත්‍රික් ලේකම්
ii. ප්‍රාදේශීය ලේකම්
iii. ගොවිජන සංවර්ධන නියෝජ්‍ය / සහකාර කොමසාරිස්
iv. පළාත් පාලන ආයතන නියෝජනය කරමින් පළාත් පාලන සහකාර කොමසාරිස් හෝ නියෝජිතයෙකු
v. දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂක
vi. පළාත් හා අන්තර් පළාත් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂකවරුන්
vii. වාරි මාර්ග අධ්‍යක්ෂක හෝ ප්‍රධාන ඉංජිනේරු
viii. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නියෝජ්‍ය අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
ix. ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
x. පළාත් ධීවර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xi. ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xii. පරිසර අධිකාරියේ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xiii. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xiv. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xv. වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xvi. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දිසා වන නිලධාරි හෝ නියෝජිතයෙකු
xvii. ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ දිස්ත්‍රික් භාර නිලධාරි හෝ ඉංජිනේරු
xviii. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xix. භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයේ නියෝජිතයෙකු
xx. ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී
xxi. පොලිස් පරිසර ඒකකයේ ස්ථාන භාර නිලධාරි
xxii. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xxiii. දිස්ත්‍රික් ගොවි සංවිධාන බලමණ්ඩලය නියෝජනය කරමින් සභාපති / ලේකම් හෝ නියෝජිතයෙකු
xxiv. ප්‍රජා ජල සංවිධාන භාර නිලධාරි හෝ දිස්ත්‍රික් නියෝජිතයෙකු
xxv. වෙනත් ප්‍රජා සංවිධාන හා පරිසර සංවිධාන වල දිස්ත්‍රික් මට්ටම නියෝජනය කරමින් එක් සංවිධානයකින් එක් නියෝජිතයෙකු

*සැ:යු* :- ***එල්ලංගා පද්ධති බලප්‍රදේශ සීමාව තුළ අදාළ ආයතනයේ බල ප්‍රදේශ එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී එම එක් එක් බල ප්‍රදේශය නියෝජනය කරමින් ඉහත අනුව බලයලත් නිලධාරීන් සහභාගී විය යුතුය.***

### 3.5. එල්ලංගා පද්ධති කළමණාකරණ කමිටුවක නිලධාරී මණ්ඩලය - ප්‍රාදේශීය මට්ටම

i. එල්ලංගා පද්ධතියට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී සහභාගී වන සෑම ප්‍රාදේශීය ලේකම්වරයෙක්ම කමිටුවේ සම සභාපති ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය.

ii. එල්ලංගා පද්ධතියට අදාල ගොවිජන සේවා බල ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී කමිටුවේ ලේකම් ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය. එල්ලංගා පද්ධතියට ගොවිජන සේවා බල ප්‍රදේශ එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවන්හි දී වැඩි පෝෂිත අක්කර ගණනක් පවතින බල ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී ලේකම් ලෙස කටයුතු කළ යුතුය.

iii. කමිටුවේ සභාපතිවරයාගේ උපදෙස් පරිදි ලේකම්වරයා විසින් රැස්වීම් කැඳවීම සිදු කළ යුතුය.

### 3.6. එල්ලංගා පද්ධති කළමණාකරණ කමිටුවක නිලධාරී මණ්ඩලය - දිස්ත්‍රික් මට්ටම

i. එල්ලංගා පද්ධතියට දිස්ත්‍රික් එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී සහභාගී වන සෑම දිස්ත්‍රික් ලේකම්වරයෙක්ම කමිටුවේ සම සභාපති ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය.

ii. එල්ලංගා පද්ධතියට අදාළ දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් කමිටුවේ ලේකම් ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය. එල්ලංගා පද්ධතියට ගොවිජන සේවා බල ප්‍රදේශ එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවන්හි දී වැඩි පෝෂිත අක්කර ගණනක් පවතින දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් ලේකම් ලෙස කටයුතු කළ යුතුය.

iii. කමිටුවේ සභාපතිවරයාගේ උපදෙස් පරිදි ලේකම්වරයා විසින් රැස්වීම් කැඳවීම සිදු කළ යුතුය.

04. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ තිරසර බව රඳා පවතින ප්‍රධාන අංගයක් වන ජෛව පද්ධති කළමනාකරණය සඳහා එල්ලංගා වාරිමාර්ග කළමනාකරණය විධිමත් කිරීම සඳහා පිහිටවනු ලබන එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු [Cascade Management Committee (CMC)] තුළින් අපේක්ෂිත කාර්යභාරය ඉටුකරගැනීම සඳහා ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

ඒ.එච්.එම්.එල්.අබේරත්න
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්

පිටපත් :-

i. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශීය කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
ii. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
iii. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
iv. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය
v. පොලිස්පති, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව
vi. අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
vii. අධ්‍යක්ෂ ජනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව
viii. අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
ix. අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
x. වන සංරක්ෂක ජනරාල්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

xi. අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
xii. අධ්‍යක්ෂ ජනරාල්, ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
xiii. අධ්‍යක්ෂ ජනරාල්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
xiv. අධ්‍යක්ෂ ජනරාල්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
xv. අධ්‍යක්ෂ ජනරාල්, ජලජීවී වගා සංවර්ධන අධිකාරිය
xvi. අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම පරිසර අධිකාරිය
xvii. අධ්‍යක්ෂ ජනරාල්, භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය
xviii. සභාපති, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
xix. සමාගාධිකාරී, ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය
xx. සියලුම පළාත් ලේකම් වරුන්, පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය
xxi. ලේකම්, පළාත් වාරිමාර්ග අමාත්‍යාංශය
xxii. සියලුම පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂකවරුන්, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
xxiii. සියලුම පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂකවරුන්, පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
xxiv. ව්‍යාපෘති අධ්‍යක්ෂකවරුන් - CSIAP/ CRIWMP/ SARP
xxv. සියලුම ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස් වරුන්

(කාරුණික දැනගැනීමට සහ අවශ්‍ය කටයුතු සඳහා)

ඇමුණුම් අංක 02

හරස්කඩ චාරිකාව සඳහා සහභාගී වූ හවුල්කාර ආයතන වල ලේඛණය

1. ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
2. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
3. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
4. පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
5. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
6. ජාතික ජලජ ජීවී සංවර්ධන අධිකාරිය
7. ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව - කුරුණෑගල
8. දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය
9. ගොවි සංවිධානය - වරාගම්මන
10. ගොවි සංවිධානය - බොර වැව